ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"..... උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන්ද, ගින්නෙන්ද, නුඹලා බෞතිස්ම කරන සේක." ලූකස් 3 : 11)

83 වන වෙළුම අංක 04 (976) 2024 ජූලි / අගෝස්තු

ඉහළ සිට බලය

(මොරවියන් ඉවැන්ජලිස්ත ජෝන් ග්‍රීන්ෆීල්ඩ් විසිනි.)

ස්වාමී වූ දෙවියන් වහන්ස .....,
ශුද්ධාත්මයාණන් වහන්ස .....,
මේ පිළිගත් පැයේ දී ...
පෙන්තකොස්ත දිනයේ මෙන් ...,
ඔබගේ සියලු බලයෙන් බැස එන්න...,

අපි එක එකඟතාවයකින්, අපගේ නියමිත
ස්ථානයේ දී හමුවී,
අපගේ ස්වාමින් වහන්සේගේ පොරොන්දුව...,
සියලු කරුණාවේ ආත්මය බලා සිටිමු....,

තරුණ, මහළු අය ඉහළින් පැමිණෙන...
ප්‍රඥාව සමඟ පුඹුදුවන්න...,
යාච්ඤා කිරීමට, ප්‍රශංසා කිරීමට, ආදරය කිරීමට
.....,
අපට එවැනි හදවත් සහ ගිණි ඇවිළෙන දිව් ....,
ලබාදෙන්න.....!

වසර සියයකට පෙර ස්කොච් මොරවියන් කවියෙකු සහ ගීත රචකයෙකු වූ "ජේම්ස් මොන්ට්ගොමරි" (1771-1854) මෙසේ ගායනා කළේය. තවත් පෙන්තකොස්ත දිනයක් සඳහා 1727 අගොස්තු 13 වෙනි දින "ජර්මනියේ හර්න්හුට්" හි දී ඔහුගේ යාච්ඤාවට ඔහුගේ ආත්මික පියවරුන්ගේ අත්දැකීම් වලින් ආනුභාවය ලැබුණු බව නිසැකය. අපගේ දවස් වෙනුවෙන්ද තවත් පෙන්තකොස්ත දිනයක් සඳහා "ජේම්ස් මොන්ට්ගොමරි" ගේ දැඩි යාච්ඤාවට සම්බන්ධවීම හොඳය. ඩී.එල්. මුඩි ඔහු ආත්මිකව උපන් ස්ථානය වන "බොස්ටන්" හී ඔහුගේ අවසාන දේශනයකදී ශුද්ධාත්මයාණන් වහන්සේ ගැන මෙලෙස කථා කළේය.

උන්වහන්සේ පෙන්තකොස්ත දවසේදී පැමිණි ආකාරය බලන්න. උන්වහන්සේ නැවත පැමිණෙන එම ස්ථානය සෙලවීමට යාච්ඤා කිරීම ලෞකික දෙයක් නොවේ. මම විශ්වාස කරන්නේ පෙන්තකොස්ත දිනයේ ආදර්ශයයි. පෙන්තකොස්ත දිනය නැවත කිසිදාක සිදුවිය නොහැකි ආශ්චර්යයක් ලෙස සිතීමේ දුක්ඛිත වැරැද්ද සභාව විසින් කර ඇති බව මම සිතමි. පෙන්තකොස්ත දිනය නැවත ඉටු කළ නොහැකි අතීත ආශ්චර්යයක් බව මම ද සිතුවෙමි. පෙන්තකොස්ත දිනය ආශ්චර්යමත් දිනයක් ලෙස බලා යාච්ඤා කිරීමට පටන් ගත්තා නම් අපට මෙහි බොස්ටන් හී පැරණි පෙන්තකොස්ත ගින්න තිබෙන බව මම දැන් විශ්වාස කරමි.

මොරවියන් ඉතිහාසඥයෙක් ගෝලයන් ලෙස ඒ හා සමාන සුවිශේෂ ප්‍රවණතාවයක් තුළ මෙලෙස ලියා ඇත. "දෙවියන් වහන්සේ පැවසුවේ..., එය සිදුවනු ඇත. මම ආත්මය වගුරුවමි. දෙවියන් වහන්සේ යෝවෙල් අනාගතවකතෘ තුලින් මෙය පොරොන්දු වූ සේක." යනුවෙනි.

එම පොරොන්දුවේ පළමු ඉටුවීම පෙන්තකොස්ත දවසේ යෙරුසලමේදී ඉටු විය. එම පොරොන්දුවේ එකම සහ අවසාන ඉටුවීම එය බව දැක්වීමට කිසිවක් අළුත් ගිවිසුමේ නොමැත. නමුත් ක්‍රියා පොතේ අපි කියවනු ලබන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීම නැවත, නැවත සිදු වූ බවයි. උදාහරණ වශයෙන්, සමාරියේදී, (ක්‍රියා 8:14-17) එපීසයේදී (ක්‍රියා 19:1-7) සහ අන්‍යජාතීන් සම්බන්ධයෙන් පවා ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීම සිදු වූ සේක. (ක්‍රියා 10:44-47)

සභා ඉතිහාසය ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීම් පිළිබඳ වාර්තා වලින් බහුලව තිබෙන බව දක්නට ඇත. ඇත්ත වශයෙන්ම 1727 අගෝස්තු 13 වන දින ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීමේ දිනයක් විය. අපි දෙවියන් වහන්සේගේ හස්තය සහ උන්වහන්සේගේ ආශ්චර්යයන් දුටුවෙමු. අපි සියල්ලෝම ඔවුන්ගේ ආත්මයෙන් බෞතිස්ම වූ අපේ පියවරුන්ගේ වළාකුල යට සිටියෙමු. ශුද්ධාත්මයාණන් වහන්සේ අප මතට පැමිණි අතර ඒ දවස්වල අප අතර මහත් ලකුණු හා පුදුම සිදුවිය. එතැන් සිට යන්තම් දවසක් ගෙවී ගිය අතර අපි උන්වහන්සේගේ සර්වබලධාරී ක්‍රියා දුටුවෙමු. දෙවියන් වහන්සේගේ වචනය අපව හිමිකරගෙන තිබූ අතර විශාල පිපාසයක් ඒ සඳහා ඇති විය. එවිට අපිට සෑම දිනකම දේව මෙහෙයන් තුනක් පැවැත්වීමට සිදුවිය. එනම් අළුයම 5.00 ට, උදෑසන 7.30 ට සහ උදෑසන 9.00 ට විය. ශුද්ධාත්මයාණන් වහන්සේගේ සම්පූර්ණ පාලනය යටතේ තිබීම සියලුදෙනාම අනිත් සෑම දෙයකට වඩා අශා විය. තමාටම ප්‍රේමා කිරීම, තම කැමැත්ත මෙන්ම සියලු අකීකරුකම් අතුරුදහන්වී, අති මහත් කරුණාවේ සැඩ පහරක් අප සියල්ලන්වම දිව්‍ය ප්‍රේමයේ මහා සාගරයට ගසාගෙන ගියේය.

ක්‍රිස්තුස් වනහන්සේගේ සමීපත්වය

ඇත්තටම 1727 අගෝස්තු 13 වන බදාදා පෙරවරුවේ බර්තෙල්ස්ඩොෆ් හී රාත්‍රී භෝජනය පැවැත් වූ දේව මෙහෙයේදී සිදුවූයේ කුමක්දැයි කිසිවෙකුට සම්පූර්ණයෙන් විස්තර කළ නොහැකි විය. ඔවුන් එදින දහවල් දෙවියන් වහන්සේගේ ගෘහයෙන් පිටත්ව ගියේ ඔවුන් පොළොවට අයිතිද, නැතිනම් දැනටමත් ස්වර්ගයට ගොස් ඇද්දැයි නොදැනය. වසර ගණනාවකට පසුව ඒ පිළිබඳව "සින්සැම්ඩොෆ්" බ්‍රිතාන්‍ය ප්‍රේක්ෂකයන්ට පහත සඳහන් විස්තරය ලබා දුන්නේය.

මීට වසර විසිහතකට පෙර "බර්තෙල්ස්ඩොෆ්" දේවස්ථානයේ (දැන් "හර්මිහුට්" දේවස්ථානයේ) රාත්‍රී භෝජන දේව මෙහෙය සඳහා සෙනඟ රැස්ව සිටි අතර ඔවුන් සියල්ලන්ම තමන් ගැනම සැහීමකට පත්නොවීය. ඔවුන් ඒත්තුගැන්වී සිටි නිසා එකිනෙකා ගැන විනිශ්චය කිරීම අතහැර දමා තිබුණේය. සෑම කෙනෙකුම දෙවියන් වහන්සේ ඉදිරියෙහි තමාගේ වටිනාකමක් නොමැතිකම සහ සෑම කෙනෙකුටම මෙම රාත්‍රී භෝජන දේව මෙහෙයේදී තමන්ගේ ගැලවුම්කරුවාණන්ගේ උතුම් වූ මුහුණ දෙස බලා සිටීමට හැගුණේය.

"උන්වහන්සේගේ හිස තැලීම් වලින් පිරිලා .....,
ඒ නිසා වේදනාව සහ උපහාසය පිරී ඇත. "

දුක සහ ශෝකයට පත්ව සිටි උන්වහන්සේ දෙස බැලීමෙන් හදවත්වලට හගවා දුන්නේ උන්වහන්සේ ඔවුන්ගේ අනුශාසකයා සහ ඔවුන්ගේ පූජකයා වන බවයි. මේ ස්ථීර විශ්වාසය අද දවසේදී එක මොහොතකින් සියල්ල වෙනස්වී ඔවුන්ගේ කඳුළු ප්‍රීතියටත් ඔවුන්ගේ කණස්සල්ල සතුටටත් හැරුණි. ඔවුන්ගේ සතුට තවත් දස දහස් ගණන් දෙනා අතර ගලායන්නට සැලැස්වීය. එමෙන්ම ස්වර්ගීය කරුණාව ඔවුන්ගේ ජීවිතවලට නැවත වරක් ලබා ගැනීමට උපකාර කරනු ලැබීය. එය දස දහස් ගණන් අවස්ථාවලදී තහවුරු කරනු ලැබීය.

පහත සඳහන් සාරාංශය අපගේ ආදරණීය බිෂොප්වරයෙක් වූ "එඩ්වඩ් රොන්ඩිතාලර්" විසින් ගෙන එන ලදී.

"සින්සෙන්ඩොෆ්" මෙම අපූරු සිදුවීම පිළිබඳව ගැඹුරු සහ විචිත්‍රවත් වාර්තාවක් අපට ලබාදෙයි. එය ක්‍රිස්තුස් වහන්සේගේ සමීපත්වය පිළිබඳව හැඟීමක් එක් මොහොතකින් පැමිණ සිටි සියලුම සාමාජිකයන්ට ලබා දුන් බව පවසයි. එය කොයිතරම් සැබෑවක් ද කියනවා නම් රැස්වීම පැවැත්වෙන බව නොදැන සැතපුම් විස්සක් ඔබ්බෙන් වැඩකරමින් සිටි සාමාජිකයන් දෙදෙනෙක් එම ආශිර්වාදය ගැනම ගැඹුරින් ඒ වෙලාවේම දැන සිටියෝය. මෙම සාමාජිකයන් සියලුදෙනාම ගිහියන් වූ අතර පසුකාලයකදී දේවසේවකයන්, මිෂනාරිවරුන්, උපස්ථායකයන්, පෙස්බිටවරුන් සහ බිෂොප්වරු පුදුමාකාරයෙන් ආශිර්වාදලත් සභාව තුළින් පැණ නැගුණේය. ඔවුන් සියලුදෙනාම ගිහියන් වූ නමුත් තවත් අර්ථයකින් අත්දැකීම් තුළ ඔවුන් සියල්ලෝම ක්‍රිස්තුස් වහන්සේගේ සේවකයන් ලෙස සාදනු ලැබූ සේක. **"නුඹලාත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කරුණාකොටගෙන දෙවියන් වහන්සේට ප්‍රසන්න වූ ආත්මික පූජා ඔප්පු කරන පිණිස ශුද්ධ පූජක සමූහයක්වීමට ආත්මික ගෘහයක් කොට ජීවමාන ගල් වෙන් ගොඩනගනු ලබන්නහුය."** (1 පේත්‍රුස් 2:5)

2 පිටුවට

1 පිටුවෙන්

ඉහළ සිට බලය...

එය අගෝස්තු 13 වන දින ආශිර්වාද ලබාගත් තරුණ සභාවකි. ඔවුන්ගේ නායකයා වූ සින්සෙන්ඩොෆ්ගේ වයස අවුරුදු විසිහතක් විය. සංගණනයක් කළේ නම් මුළු සභාවම දළ වශයෙන් ඔහුගේම වයසේ අය බව සොයා ගැනීමට ඉඩ තිබුණි. අළුත් කරනු ලැබූ (නැවත පුබුදුවාලනු ලැබූ) සභාවේ පළමු සේවකයන් පිළිබඳ කථාව පුරාවටම සෝදිසිකර බැලූ විට සහ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් එවන් පුදුමාකාර ඇදහිල්ලක් පවත්වාගෙන යන පුරුෂයන් හා කාන්තාවන් සන්සන්ධනාත්මකව බැලූ විට යෞවනයන් බව අපි අවබෝධ කරගන්නෙමු.

නූතන පෙන්තකොස්තයක්

ශුද්ධාත්මයාණන්ගෙන් බෞතිස්මවීමේ අවශ්‍යතාවය සහ හැකියාව පිළිබඳව ශ්‍රේෂ්ඨ ඇමරිකානු එවැන්ජලිස්තවරයාගේ මූලධර්මය මොරවියන් සභාවේ ඉතිහාසිය සනාථ කරයි. ශත වර්ෂ දෙකකට පෙර මොරවියන් සහෝදරයන්ගේ ආත්මික අත්දැකීම් පෙන්තකොස්ත බලයට සමාන කැපී පෙනෙන සමානකමක් දක්වන අතර එහි ප්‍රතිඵලය අපෝස්තුළුවරුන්ගේ දවස්වලදී මෙන් දකින්නට ලැබේ. යෙරුසලමේ සහ හර්මියුට් හි ඇදහිලිවන්තයන්ගේ සමාගම ආත්ම තුන්සියයකට වඩා අඩු විය. සභාවන් දෙකම ලොකික බලපෑමෙන්, ප්‍රඥාවෙන්, බලයෙන් සහ ධනයෙන් සම්පූර්ණයෙන්ම තොර වූ මනුෂ්‍යයන් විය. ඔවුන්ගේ සතුරන් ඔවුන්ව හැඳින්වූයේ නූගත් සහ පහත් අය ලෙසයි. නමුත් ඔවුන්ගේ ස්වභාවය දේව වචනයේ විස්තර කර ඇත්තේ මෙසේය. ***"එක්නිසාද සහෝදරයෙනි, නුඹලාගේ කැඳවීම එනම්, මාංසය ලෙස ප්‍රඥාවන්ත බොහෝ දෙනෙක්වත්, බලවන්ත බොහෝ දෙනෙක්වත්, වංශවත් බොහෝ දෙනෙක්වත්, කැඳවනු නොලැබූ බව බලාපල්ලා. නමුත් දෙවියන් වහන්සේ ප්‍රඥාවන්තයන් ලැජ්ජාවට පවුළුවන පිණිස ලෝකයේ මෝඩ දේවල් තෝරාගත් සේක. දෙවියන් වහන්සේ ශක්තිමත් දේ ලැජ්ජාවට පවුළුවන පිණිස ලෝකයේ දුර්වල දේවල් තෝරාගත් සේක. ඇත්තා වූ දේවල් නැති කරන පිණිස, නැති දේවල් වැනි ලෝකයේ පහත් දේවල් ද සුළුකොට සිතනු ලබන දේවල්ද දෙවියන් වහන්සේ තෝරාගත් සේක."*** (1 කොරින්ති 1:26-29)

මෙම කුඩා සහ දුර්වල සභා දෙකටම දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ආත්මය වගුරුවා ඔවුන්ට ඉහළින් ලැබෙන බලය ලබා දුන් සේක. මේ ඇදහිලිවන්තයන් ස්වභාවිකවම ලෙහෙසියෙන්ම බිය ගැන්වෙන සුළු වුවත් අස්වභාවික දැනුම සහ බලය ඔවුන් සතු බව පෙනෙන්නට තිබුණි. ඔවුන් ගිණි දැල්වෙන ඉවැන්ජලිස්තවරුන් බවට පරිවර්තනය විය. දෙවියන් වහන්සේ ඔවුන්ට වචන සහ ප්‍රඥාව ලබා දුන් අතර එයින් ඔවුන්ගෙන් කිසිවෙකුට විරුද්ධවීමට හෝ ප්‍රතිරෝධතාවය දැක්වීමට අන් කිසිවෙකුට නොහැකි විය. විරුද්ධවාදීකම් සහ පීඩාවන් නිසා යෙරුසලමේ සභාව විසිර ගිය නමුත් ඔවුන්ගේ සාක්ෂි දැරීම නිශ්ශබ්ද කිරීමට නොහැකි විය. මක්නිසාද අපට මෙලෙස කියා තිබේ. ***"එබැවින් විසුරුවනු ලැබූ ඔවුහු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශ කළෝය."*** **(ක්‍රියා 8:4)**

ඒ හා සමාන අත්දැකීම් මොරවියන් සහෝදරයන් අතර ද බොහෝ සෙයින් තිබුණේය. ශ්‍රේෂ්ඨ බොහිමියානු ප්‍රතිසංස්කරණවාදියෙකු වූ ජෝන් හස්ගේ ශ්‍රමය හා වේද සාක්ෂිකාර ජීවිත පූජා කිරීම තුළින් පැණ නැගුණු සහෝදරයන් සියවස් ගණනාවක් පීඩා විඳිමින් සිටියෝය. බොහෝ අය ඔවුන්ගේ ලේ වලින් ඔවුන්ගේ සාක්ෂිය මුද්‍රා තබා ඇත. සිරගත කිරීම, වධහිංසා පැමිණවීම සහ පිටුවහල් කිරීම නිසා ඔවුන් තම පියවරුන්ගේ නිවෙස් අතහැර ජර්මනියේ රැකවරණය සඳහා පලා ගිය අතර එහිදී තරුණ ක්‍රිස්තියානි වංශාධිපතියෙකු වූ "කවුන්ට් සින්සෙන් ඩොෆ් " ඔවුන්ට " සැක්සෝනියේ" ඔහුගේ වතුවල රැකවරණය ලබා දුන්නේය. ඔවුන් ඔවුන්ගේ නව නිවස හර්න්හට්, ස්වාමින් වහන්සේ බලා සිටින සේක කියා නම් කළ අතර, ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් බොහීස්ම වූ පසු එම ස්ථානයෙන් ඔවුන් ලෝකයේ විවිධ ස්ථානවලට පිටත්ව ගිය ඉවැන්ජලිස්තවරුන් සහ මිෂනාරිවරුන් බවට පත්විය. ඔවුන්ගේ අළුත් නායකයා වූ කවුන්ට් සින්සෙන්ඩොෆ්ට ඔවුන් ගැන සැබවින්ම මෙසේ ප්‍රකාශ කළ හැකි විය.

සෑමතැනකම මහා හඬින් කෑ ගසමින් ...,
නිරයේ දොරටු සොළවන ඝෝෂාවන් ...,

ඔබගේ අභිෂේකලත් සාක්ෂිකාර වලාකුළ ...,
ඔබගේ හා මිදීම ගැන ගීකියයි .... !

ඔවුන්ගේ අධ්‍යාත්මික පෙන්තකොස්තයෙන් පසු පළමු දශක තුන තුළ ඔවුන් බැටළු පැටවාණන්ගේ රුධිරයෙන් ලැබෙන ගැලවීමේ සුභාරංචිය යුරෝපයේ සෑම රටකම පමණක් නොව ඇමරිකාවේ උතුරේ සහ දකුණේ, ආසියාවේ, අප්‍රිකාවේ බොහෝ මිත්‍යාදෘෂ්ඨික ජාතීන් වෙත ගෙන ගියහ. එය ආරම්භ වූයේ 1727 අගෝස්තු 13 වෙනිදාය. කවුන්ට් සින්සෙන්ඩොෆ් එය හැඳින්වූයේ සභාව මත ශුද්ධාත්මයාණන් වහන්සේගේ උතුරා ගැලීමේ දිනය ලෙසයි. එය පෙන්තකොස්ත දිනය යනුවෙන් නැවතත් ඔහු විස්තර කළේ මෙසේය. අපට මෙතෙක් කිසිදු අත්දැකීමක් හෝ දැනුමක් නොතිබුණත් ආත්මයාණන් වහන්සේට අප වෙතට පැමිණීමට ගැලවුම්කරුවාණන් වහන්සේ අවසර ලබා දුන් සේක. මෙතෙක් අපි නායකයන් සහ සභා නායකයන් වී සිටියෙමු. නමුත් දැන් ශුද්ධාත්මයාණන් වහන්සේම සියල්ල සහ සියල්ලන්වම පාලනය කළ සේක.

එබැවින් ඔහු යේසුස් වහන්සේට මෙසේද යාච්ඤා කළේය. "ස්වාමීනී ...., අපගේ උත්තම පූජකයා සහ ගැලවුම්කරුවාණෙනි..., අපගේ සියලුම පූජක කණ්ඩායම් මත ගින්න සහ ආත්මයේ උද්යෝගය වගුරුවන්න. අපි මැදහත්කාරකම් කරමින් ඔබගේ සෙනඟ වෙනුවෙන් කන්නලව් කරන විට, අපගේ දෑත් අල්ලාගත මැනව....! "

ශුද්ධාත්මයාණන් වහන්සේගේ මහිමාන්විත සේවය

(රවී කාර්මයිකල් විසිනි)

"ඒ නිසා නුඹලා ඥානය නැත්තන් වෙන් නොව, ඥානවන්තයන් වෙන් ප්‍රවේශවෙන් හැසිරෙන්ට බලාගෙන දවස් නපුරු බැවින් ප්‍රස්තාව අල්ලා ගනිල්ලා වේ නිසා නුඹලා අඥවනයෝ නොවී ස්වාමීන් වහන්සේගේ කැමැත්ත කිමෙක් ද කියා තේරුම් ගනිල්ලා. ව්‍යුළිකපානයෙන් මත්නොවෙල්ලා. එයින් අනාචාරකම් හටගන්නේය. නමුත් ආත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වී, ගීතිකාවලින්ද, කවිවලින්ද ආත්මික ගී වලින්ද එකිනෙකාට කතාකොට නුඹලාගේ සිත් වලින් ස්වාමීන් වහන්සේට ගායනාද, ගීතිකා ද කරමින් අපගේ ස්වාමී වූ යේසුස් වහන්සේගේ නාමයෙන් සියලු දේ ගැන පියවූ දෙවියන් වහන්සේට නිතරම ස්තුති කරපල්ලා." **(එපීස 5:15-20)**

මේ අවසාන දවස්වලදී ඇදහිලිවන්තයන් ලෙස අපගේ ජීවිතයේ එක් වැදගත් කාරණයක් නම්, අපි ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරී සිටිය යුතු බවයි. අපගේම ආත්මික ජීවිතය උදෙසා උන්වහන්සේගේ පූර්ණත්වය සහ ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීම සඳහා සූදානම්වීමට පමණක් නොව මෙම අන්තරා සහිත කාලවලදී අන්‍යයන් වෙත ළඟාවීමට සහ උපස්ථාන කිරීමට ද එය අපට අවශ්‍යව තිබේ. යක්ෂයා තම කාලය කෙටි බව දන්නා නිසා හැකි තරම් මනුෂ්‍යයන්ව රැවටීමට සහ විනාශ කිරීමට සියලු නැවතීමේ සීමාවන් ඉවත්කර දමයි. අප අවට සිටින මනුෂ්‍යයන්ට අවශ්‍ය කරන්නේ ආත්මයෙන් පිරුණු ඇදහිලිවන්තයන්ගේ සාක්ෂිය සහ දේව සේවයයි. අපි පැහැදිලිවම මේ පැයේ දී හෝ ඕනෑම පැයකදී අප තුළ ප්‍රමාණවත් ලෙස වුවමනා ක්‍රියා මාර්ග ඉටුකරන්නේ නැත. නමුත් ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ අපට ආත්මික ජීවිතයේ සහ ඵලදැරීමේ පූර්ණත්වය තුළ උතුරා යා හැකිය. ආත්මයාණන් වහන්සේගේ මහිමාන්විත සේවයේ මෙම සත්‍යතාවයන් කිහිපය කෙරෙහි සැලකිල්ලෙන් යුතුව අවධානය යොමු කර බලන්න.

ශුද්ධාත්මයාණන් වහන්සේ අපව බලයෙන් පූර්ණකරන සේක

යේසුස් වහන්සේ උන්වහන්සේගේ ගෝලයන්ට පැවසුවේ ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් කෙරෙහි පැමිණිවිට ඔවුන් බලය ලබන බවත්, ඔවුන් යෙරුසලමේ සහ ඉන් ඔබ්බටත්, පොළොවේ සීමාව දක්වාත් උන්වහන්සේගේ සාක්ෂිකාරයන් වන බවත්ය. (ක්‍රියා 1:8) ඔවුන්ට ලබා දුන් උපදෙස් පරිදි ඔවුන් නතරවී බලා සිටිමින් යාච්ඤා කළ අතර පෙන්තකොස්ත දිනයේ දී ස්වාමීන් වහන්සේගේ පොරොන්දුව පරිදි ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ඔවුන්ව පුරවනු ලැබූ සේක. ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන්ව බලයෙන් පුරවා, ඔවුන්ව ධෛර්යමත් කර, ශක්තිමත් කරනු ලැබූ අතර ඔවුන් ධෛර්යමත්ව හා ඵලදායි ලෙස සුභාරංචිය ප්‍රචාරය කළේ යේසුස් වහන්සේ පැවසූ ලෙසින්ම විය. යේසුස් වහන්සේ ඒ වන විටත් උන්වහන්සේගේ සේවයේ දී ආත්මයාණන් වහන්සේගේ බලය අත්දැක තිබුණු සේක. උන්වහන්සේ එය මුල සිටම ඒත්තුගනු ලැබූ සේක. ***"ස්වාමීන් වහන්සේගේ ආත්මය මා කෙරෙහිය. දිළිඳුන්ට සුභාරංචිය දේශනා කරන්ට උන්වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට විඳීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශ කරන්ටද වධනා ලද්දවුන් නිදහස්කර හරින්ටද, ස්වාමීන් වහන්සේගේ පිළිගත යුතු වූ අවුරුද්ද ප්‍රකාශ කරන්ටද උන්වහන්සේ මා එවූ සේකැයි ලියා තිබෙන ස්ථානය සොයාගෙන පොත භකුලා සේවකයාට දී වැඩහුන් සේක. එකල සිනගෝගයෙහි සිටි සියල්ලෝ උන්වහන්සේ කෙරෙහි ඇස් හෙළාගෙන සිටියෝය."*** (ලූක් 4:18-20)

අශුද්ධාත්ම දුරුකරනු ලැබුවේ දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන බව උන්වහන්සේ ප්‍රකාශ කළ සේක. (මතෙව් 12:28) ප්‍රේත්‍රුස් ***අපෝස්තුළුවරයා එය විස්තර කරන්නේ මෙසේය. "***

3 පිටුවට

2 පිටුවෙන්

ශුද්ධාත්මයාණන් වහන්සේගේ...

දෙවියන් වහන්සේ, ශුද්ධාත්මයෙන්ද, බලයෙන්ද, නාසරීය යේසුස් වහන්සේ ආලේප කළ බවත්, දෙවියන් වහන්සේ, උන්වහන්සේ සමඟ සිටි බැවින්, උන්වහන්සේ යහපත්කම් කරමින්ද, යක්ෂයා විසින් පීඩාකරන ලද සියල්ලන් සුවකරමින්ද හැසිරුණු බවත්ය." (ක්‍රියා 10:38) සුභාරංචිය නිර්හීතව හා ඵලදායි ලෙස බෙදා ගැනීමටත් යහපත් දේ කිරීමටත්, බිදුණු සිත් ඇති අයට සේවය කිරීමටත් අද දවසේ දී අපට එම අස්වභාවික බලය අවශ්‍ය නොවන්නේද ... ? **"එහෙත් මම වනාහී යාකොබ්ට ඔහුගේ වරදත්, ඊශ්‍රායෙල්ට ඔහුගේ පාපයත්, දන්වන්ට ස්වාමීන් වහන්සේගේ ආත්මය ඇතුව බලයෙන්ද, යුක්තියෙන්ද, ධෛර්යයෙන්ද, පූර්ණව සිටිමි."** (මීකා 3:8)

ශුද්ධාත්මයාණන් වහන්සේ සත්‍යතාවයේ ආත්මයාණන් වහන්සේ වන අතර වුළු සත්‍යය කරා අපට මඟපෙන්වන සේක. (යොහාන් 16:13)

වංචාව වැඩිවෙන්නා වූ මේ අවසාන දවස්වලදී සත්‍යයේ සහ ආත්මික සියුම් අවබෝධය ඇතිව සිටීමේ අවශ්‍යතාවය වඩා වැදගත්ව තිබේ. ප්‍රේරිත පාවුල් පෙන්වා දෙන පරිදි....., **"එහෙත් පසු කාලවලදී සමහර වුලාකරවන ආත්මයන්ද, යක්ෂයන්ගේ ශික්ෂාකම්ද සලකා ඇදහිල්ලෙන් අහක්ව යනවා ඇතැයි ආත්මයාණන් වහන්සේ පැහැදිලි ලෙස කියන සේක."** (1 තිමෝති 4:1) යේසුස් වහන්සේ මෙසේ අනතුරු ඇඟවූ සේක. **"වක්නිසාද බොරු ක්‍රිස්තුස්වරුද, බොරු අනාගතවක්තෘවරුද නැගිට පුළුවන්නම් තෝරාගනු ලැබූවන් පවා වුලාකරන ලෙස මහත් ලකුණුද, පුදුමද, දක්වන්නෝය." (මතෙව් 24:24) සත්‍යතාවය තුළ වඩා හොඳින්** පැවතීමට අපට සත්‍යතාවයේ ආත්මයාණන් වහන්සේව අවශ්‍ය වේ. යක්ෂයාගේ උපායවලට විරුද්ධව නැගී සිටීමට අපට හැකිවන පරිදි සැබෑකමේ ඉඟපටිය ඇතුළුව දෙවියන් වහන්සේගේ සම්පූර්ණ ආත්මික යුද්ධායුධ කට්ටලය පැළඳගැනීම අවශ්‍යව තිබේ. (එපීස 6:11 සිට කියවන්න.) **"ගැලවීම නැමති ආරක්ෂා හෙල්මටයද දෙවියන් වහන්සේගේ වචනය නැමති ආත්මයාණන් වහන්සේගේ කඩුවද ගනිල්ලා."** (එපීස 6:17) අපගේ ගුරුවරයා ලෙස ශුද්ධාත්මයාණන් වහන්සේ දෙස අපි බලා සිටිය යුතුය. (යොහාන් 14:26, 1 යොහාන් 2:27) ආත්මික සත්‍යතාවයන් සහ යතාර්ථයන් ස්වභාවික මනුෂ්‍යයාට වටහාගත නොහැකිය. එය වටහාගත හැකිවන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වූ අයට පමණි.

අපොස්තුළු පාවුල් ලියා ඇති පරිදි ..., **"නුවුන් දෙවියන් වහන්සේ ස්වකීය ආත්මයාණන් වහන්සේ කරුණාකොටගෙන අපට ඒ දේ එළිදරව් කළ සේක. වක්නිසාද ආත්මයාණන් වහන්සේ සියළු දේ එසේය. දෙවියන් වහන්සේගේ ගැඹුරු දේවල් විමසන සේක. මනුෂ්‍යයෙකුගේ කාරණා මනුෂ්‍යයා තුළ තිබෙන ඔහුගේ ආත්මය හැර මනුෂ්‍යයන් අතරේ වෙන කවරෙක් දන්නේද ..? එසේම දෙවියන් වහන්සේගේ කාරණා දෙවියන් වහන්සේගේ ආත්මයාණන් විස වෙන කිසිවෙක් නොදනියි. නමුත් දෙවියන් වහන්සේ විසින් අපට දෙන ලදදේ අප විසින් දැනගන්නා පිණිස ලෝකයේ ආත්මය නොව දෙවියන් වහන්සේගෙන් වූ ආත්මය ලැබීමුව."** (1 කොරින්ති 2:10-12) අපි ස්වාමීන් වහන්සේ සහ උන්වහන්සේගේ වචනයත්, උන්වහන්සේ අප වෙනුවෙන් තබා ඇති සියල්ල දැනගන්නා පිණිසත්, ආත්මයාණන් වහන්සේ කරුණාකොටගෙන ලබාදෙන්නා වූ එළිදරව් කිරීම ගැන ස්වාමීන් වහන්සේට ප්‍රශංසා කරමු.

ශුද්ධාත්මයාණන් වහන්සේ ජීවනයේ, ප්‍රීතියේ, සාමයේ සහ බලාපොරොත්තුවේ උල්පත වන සේක.

ශුද්ධාත්මයාණන් වහන්සේ අප තුළ පවතින බව ප්‍රකාශ කිරීමට යේසුස් වහන්සේ මෙම අලංකාර වචන භාවිතා කරමින් පැහැදිලි කළ සේක. **"මංගල්‍යයේ මහත් දවස වූ අන්තිම දවසේ යේසුස් වහන්සේ නැගිට සිට ශබ්ද පවත්වමින් යමෙකුට පිපාසා ඇත්නම් ඔහු මා ළඟට ඇවිත් බීවාවේ. මා කෙරෙහි අදහන්නා තුළින් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජීවනදායක වතුර ඇති ගංගා ගලන්නේ යයි කී සේක. උන්වහන්සේ මෙසේ කීවේ තමන් අදහාගත්තවුන් විසින් ලබන්ට සිටිය ආත්මයාණන් ගැනය. වක්නිසාද යේසුස් වහන්සේ ඒතාක්ම මහිමයට නොපැමිණී බැවින් ඒතාක්ම ආත්මයාණන් නොදෙන ලද්දේය."** (යොහාන් 7:37-39) ඒ ආකාරයෙන්ම යෙසායා අනාගතවක්තෘ ඔහුගේ කාලයේ දී මෙලෙස පැවසුවේය. **"එසේ වන්නේ උසස්ථානයෙන් ආත්මය අප කෙරෙහි වගුරුවන්ටත්, කාන්තාරය උයනක් වෙන්ටත්, උයන වනයක්කොට ගණන් ගනු ලබන්ටත් යෙදෙන තුරුය."** (යෙසායා 32:15) එවැනි පිරී ඉතිරී යන ජීවිතයක් සහ ඵලදායි ජීවියක් අපට අවශ්‍ය සහ අපි ආශා නොකරන්නේද ... ? මේ අන්තරා සහිත දවස්වලදී ප්‍රීතියේ සහ සාමයේ අවශ්‍යතාවය ගැන කුමක් කිව හැකිද .. ?

ප්‍රීතිය හා සමාදානය ආත්මයාණන් වහන්සේගේ ඵලවලට අයත්වේ. (ගලාති 5:22) දෙවියන් වහන්සේගේ රාජ්‍යය වනාහී..., **"වක්නිසාද දෙවියන් වහන්සේගේ රාජ්‍යය කෑමත්, බීමත් නොව, ධර්මිෂ්ඨකමද, සමාදානය ද, ශුද්ධාත්මයාණන් තුළ ප්‍රීතියද වේ."** (රෝම 14:17) බෙහෝ දුක් පීඩා මධ්‍යයේත් අපට ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණවිය හැකිය. **"නුඹලා බොහෝ පීඩාවෙන් යුක්තව ශුද්ධාත්මයාණන්ගේ ප්‍රීතියෙන් වචනය පිළිගැනීමෙන් අපද ස්වාමීන් වහන්සේ ද අනුව යන්නෝ වූහ."** (1 තෙසලෝනික 1:6) දෙවියන් වහන්සේගේ බලාපොරොත්තුවෙන් අප පූර්ණව සිටින පිණිස එය කොයිතරම් අනර්ඝද .... ? **"ඉඳින් ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් නුඹලා අධික බලාපොරොත්තුවෙන් යුක්තව සිටින පිණිස බලාපොරොත්තුවේ දෙවියන් වහන්සේ ඇදහිල්ලෙන් වූ සියලු ප්‍රීතියෙන්ද, සමාදානයේද, නුඹලා පූර්ණකරන සේක්වා ...!"** (රෝම 15:13)

ශුද්ධාත්මයාණන් වහන්සේ, දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙන් අපව පුරවන සේක.

බොහෝ දෙනාගේ ප්‍රේමය හීන වෙන කාලයකදී ශුද්ධාත්මයාණන් වහ්නසේ අපව දේව ප්‍රේමයෙන් පුරවන සේක. (මතෙව් 24:12) දෙවියන් වහන්සේගේ ප්‍රේමය නොකඩවා අපගේ හදවත්වලට වගුරුවනු ලැබීම අපට කොපමණ අවශ්‍යව තිබෙනවාද .. ? (රෝම 5:5) එමෙන්ම අගේ ජීවිතවල ප්‍රේමයේ ඵලදැරීමට ශුද්ධාත්මයාණන් වහන්සේව අවශ්‍ය වන්නේ කෙසේද ... ? (ගලාති 5:22) අපට අන් අයට ප්‍රේම කිරීමට සහ සේවය කිරීමට හැකිවන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ හැකියාවෙන් සහ ආත්මයාණන් වහන්සේගේ ප්‍රේමය තුලින් පමණි. (රෝම 15:30) ආත්මයාණන් වහන්සේ තුළ අපගේ ප්‍රේමය අපට අවබෝධ කරගත හැකිය. (කොලොස්සි 1:8)

ශුද්ධාත්මයාණන් වහන්සේ යනු ශුද්ධකමේ ආත්මයාණන් වහන්සේය.

"ඒ පුත්‍රයාණන් වහන්සේ මාංසාකාරයෙන් දාවිත්ගේ වංශයෙන් ඉපිද ශුද්ධකමේ ආත්මයේ ප්‍රකාරයට දේව පුත්‍රයාණන් හැටියට මළවුන්ගෙන් නැඟිටීම කරුණාකොටගෙන බලයෙන් යුක්තව ප්‍රකාශ කරනු ලැබූ සේක." (රෝම 1:5) මේ අවසාන දවස්වලදී පාපය සහ අවනීතිය බහුලව පවතියි. (මතෙව් 24:12, 2 තිමෝති 3:1-5) අපගේ ජීවිත තුළ ආත්මයාණන් වහන්සේගේ විශුද්ධ කිරීමේ ක්‍රියාව ගැන අපට කොපමණ කෘතඥ විය හැකිද .. ? (2 තෙසෙලෝනික 2:13) අපි උන්වහන්සේ තුළ ගමන් කරමු. **"නුවුත් ආත්මයාණන් වහන්සේ කරුණාකොටගෙන හැසිරියල්ලා. එවිට නුඹලා මාංසයේ තෘෂ්ණා සම්පූර්ණ කරන්නේ නැතැයි කියමි." (ගලාති 5:16) "වක්නිසාද නුඹලා මාංසික ලෙස ජීවත්වෙනවා නම් මැරෙන්නට ඕනෑය. නමුත් ආත්මයෙන් ශරීරයේ ක්‍රියා නසනවා නම් ජීවත්වෙනවා ඇත"** (රෝම 8:13) උන්වහන්සේ අපව නැවත අළුත් කරන සේක. (තීතස් 3:5) එමෙන්ම අපගේ ඇතුලාන්ත මනුෂ්‍යයා ශක්තිමත් කරන සේක. (එපීස 3:16) උන්වහන්සේගේ මහිමාන්විත සේවය කරුණාකොටගෙන ස්වාමීන් වහන්සේගේ ස්වභාවයට අපව වෙනස් කරන සේක. (2 කොරින්ති 3:18)

ශුද්ධාත්මයාණන් වහන්සේ අපේ දුර්වලකම්වලදී අපට පිහිට වෙමින් අපගේ යාච්ඤාවලදී අපට උපකාර කරන සේක.

"එලෙසම ආත්මයාණන් වහන්සේත් අපගේ දුර්වලකම්වලදී උපකාර කරන සේක. වක්නිසාද යුතු ලෙස යාච්ඤා කරන්ට අපි නොදනිමුව. නුවුත් ආත්මයාණන් වහන්සේම කිය නොහැකි කෙරිදීගැවී වලින් අප උදෙසා මැදහත්කම් කරන සේක." (රෝම 8:26) යාච්ඤා කිරීමට අපට හැකියාව ලාබදෙන සේක. **"සියලු යාච්ඤාවලින්ද, ඉල්ලීම්වලින්ද සියලු කාලවලදී ආත්මයාණන් කරනකොටගෙන යාච්ඤා කරපල්ලා".** (එපීස 6:18) යුද් පෙන්වා දෙන පරිදි ආත්මයාණන් තුළ අපගේ යාච්ඤා කිරීම අපගේ ඇදහිල්ලට සහ දෙවියන් වහන්සේ සමඟ ජීවත්වීමට අත්‍යාවශ්‍යවේ. **"නුවුත් ප්‍රේමවන්තයෙනි, නුඹලා වනාහී නුඹලාගේ ඉතා ශුද්ධ ඇදහිල්ල පිට නුඹලාව ගොඩනගා ගනිමින් ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ සිට යාච්ඤා කරමින් සදාකාල ජීවනය පිණිස අපගේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දයාව බලා සිටිමින් දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙහි පැවතියල්ලා."** (යුදස් 1:20-21)

ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ ජීවිතය මෙහෙයවන අතර සේවය සඳහා අපව සන්නද්ධ කරන සේක.

අපි සම්පූර්ණයෙන්ම රදා පවතින්නේ ආත්මයාණන් වහන්සේගේ මඟපෙන්වීම මතය. මක්නිසාද ආත්මයෙන් මෙහෙයවනු ලබන්නේ දෙවියන් වහන්සේගේ දරුවන්ව පමණි. (රෝම 8:14) ආත්මයාණන් තුළ ජීවත්වීම සහ ආත්මයාණන් තුළ ගමන් කිරීම (ගලාති 5:25) සහ ආත්මයාණන් වහන්සේ අපට දී ඇති කැඳවීම හා දීමනා මත පදනම්ව සේවය කිරීම මොනතරම් අගනා ආශිර්වාදයක්ද ..? (1 කොරින්ති 12:11, ක්‍රියා 13:2, 20:28) ඒ හා සමානව ආත්මයේ බලවත්කමින් සේවය කිරීම කොයිතරම් වරප්‍රසාදයක්ද...? (1 කොරින්ති 2:4, 1 තෙසලෝනික 1:5, 1 ප්‍රේතුස් 1:12)

පූර්ණ ගැලවීම අපගේ උසස් වරප්‍රසාදයයි

"ඔහුද පුත්‍රය නුඹ නිතර්ම මා සමඟ සිටිනෙහිය. මා සන්තක සියල්ලද නුඹේය." (ලූක් 15:31)

මීට කලකට පෙර මුඩි මහතා මට කීවේ මිට වසර දෙකකකට පෙර ඔහු "කෙස්වික්හිදී" අසා ඇති හොඳම දෙය මෙම පදය බවයි. යම් දේවසේවකයෙක් විසින් අවසන් හෝ සමුගැනීමේ පාඨයක් ලෙස එය ලබා දුන් අතර මුඩි මහතා තමාටම කියාගත්තේ මීට කලින් ඒක දැක්කෙ නැත්තේ ඇයි කියාය. අකීකරු පුත්‍රයාට පියාගේ ඇති සෙනෙහස ගැන බොහෝ දේ කථා කරන්නට, ලියන්නට ඉඩ ඇතත් පියා වැඩිමහල් පුත්‍රයාට සැලකූ ආකාරය ගැන සිතන විට පියාගේ අපූරු සෙනෙහස පිළිබඳව සැබෑ හැඟීමක් අපගේ හදවත් තුළට ගෙන එයි. එබැවින් මෙම පදය ගැන කථා කිරීමට කැමැත්තෙමි. පළමුව, දෙවියන් වහන්සේගේ දරුවන්ගේ උසස් වරප්‍රසාදය, දෙවනුව, ඔවුන් බොහෝ දෙනෙකුගේ අඩු අත්දැකීම්, තුන්වෙනුව, මෙම විශාල විෂමතාවයට හේතුව, හතරවෙනුව, නැවත යථාතත්වයට පත්කිරීමේ මාර්ගය නැතහොත් සම්පූර්ණ ගැලවීම ලබන්නේ කෙසේද යනුයි.

දෙවියන් වහන්සේගේ දරුවන්ගේ උසස් වරප්‍රසාදය

පළමුව වැඩිමහල් පුත්‍රයා තම පියා සමඟ සෑම විටම සිටීම, ඔහු කැමති නම් නොනවතින සහයෝගීතාවය සහ අසීමිත හවුල්කාරිත්වය යන කරුණු දෙකේ වරප්‍රසාදය ලබාගත්තේය. නමුත් ඔහු නාස්තිකාර පුත්‍රයා (බාල පුත්‍රයාට) වඩා නරක් විය. මන්ද සෑම විටම නිවසේ සිටියද ඔහු කිසිවිටෙකත් තමාට අයිතිව තිබූ වරප්‍රසාද දැන සිටියේ නැත. භුක්තිවිඳ නැත. එසේ නොමැති නම්, එය තේරුම්ගත්තේ නැත. මෙම සම්පූර්ණ සහයෝගීතාවය ඔහු එනතුරු බලා සිටි අතර එය ඔහුට පිරි නැමූ නමුත් ලබාගත්තේ නැත. අකීකරු පුත්‍රයා නිවසෙන් බැහැරව සිටි නිසා නිවසේ සතුටෙන් (ප්‍රීතියෙන්) ඈත්ව සිටියේය. වැඩිමහල් පුත්‍රයා නිවසේ සිටියත් වරප්‍රසාදය තේරුම් නොගත් නිසා නිවසේ සතුටෙන් (ප්‍රීතියෙන්) ඈත්ව සිටියේය.

නොනවතින ඇසුර

භූමික පියෙක් තම දරුවාට ආදරය කරන අතර තම දරුවාව සතුටු කිරීමට සතුටින් සිටින්නේය. **"ප්‍රේම නොකරන්නා දෙවියන් වහන්සේව නාඳුනයි. මක්නිසාද දෙවියන් වහන්සේ ප්‍රේමයය."** (1 යොහාන් 4:8) උන්වහන්සේ තමන්වහන්සේගේ සෙනඟ මත ස්වකීය ස්වභාවය වැගිරවීමට ප්‍රියකරන සේක. බොහෝ දෙනා දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ මුහුණ සඟවාගෙන සිටින බව කථාකරන්නෝය. නමුත් දෙවියන් වහන්සේ එසේ කරන්නේ කාරණා දෙකක් නිසා පමණි. එනම් පාපය සහ අවිශ්වාසකමයි. වෙන කිසිවක් නිසා එසේ නොකරන සේක. සූර්යයාගේ ස්වභාවය බැබළීමයි. අපට එය බැබළීමට උදව් කළ නොහැකිය. දෙවියන් වහන්සේ ප්‍රේමයයි. ගෞරවාන්විතව කථා කිරීම සමඟ ප්‍රේම කිරීමට උන්වහන්සේට උපකාර කිරීමට අපට නුපුළුවන. අභක්තිකයන් කෙරෙහි උන්වහන්සේගේ යහපත්කම සහ වැරදි කරන්නන් කෙරෙහි උන්වහන්සේගේ අනුකම්පාව අපි දකිමු. නමුත් උන්වහන්සේගේ පිය සෙනෙහස උන්වහන්සේගේ සියලු දරුවන් කෙරෙහි ප්‍රකාශ වේ. දෙවියන් වහන්සේ සමඟ සෑමවිටම සතුටින් වාසය කළ හැකිද කියා කවදා හෝ ඔබ අසන්නේද .. ? ඔව්, නිසැකවම, මේ සම්බන්ධයෙන් ශුද්ධ ලියවිල්ලේ බොහෝ පොරොන්දු ඇත. හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද ලිපිය දෙස බලන්න. **එබැවින් සහෝදරවරුනි, යෙසුස් වහන්සේ ස්වකීය මාංශය නැවතී තිර්‍ය වැදින් අප උදෙසා කැප කළා වූ මාර්ගය වන අලුත් වූ ජීවමාන මාර්ගයකින් උන්වහන්සේගේ ලේ කර්‍යකොටගෙන ශුද්ධස්ථානයට ඇතුල්වීමට අපට නිදහස්කම තිබෙන බැවින්ද...** (හෙබ්‍රෙව් 10:19-20) දාවිත් කොපමණ වාරයක් දෙවියන් වහන්සේගේ මණ්ඩපයේ, උන්වහන්සේගේ සෙවනෙහි වාසය කිරීම (සැගව සිටීම) ගැන කතා කළේද ..? **"මක්නිසාද විපත්ති දවසේදී උන්වහන්සේ ස්වකීය විමානයෙහි මා වසා තබන සේක. ස්වකීය මණ්ඩපයෙහි වූ අප්‍රකාශස්ථානයෙහි මා සඟවන සේක. උන්වහන්සේ පර්වතයක් පිට මා ඔසවා තබන සේක."** (ගීතාවලිය 27:5) **"මහෝත්තමයාණන්ගේ රහස් ස්ථානයෙහි වසන තැනැත්තේ සර්වපර්‍යාප්තයාණන්ගේ සෙවනෙහි වාසය කර්‍යන්නේය."** (ගීතාවලිය 91:1)

මාගේ පණිවිඩය නම්, ඔබේ ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ මුහුණේ ආලෝකයෙන් නිරන්තරයෙන් ඔබ ජීවත්වෙනවාට උන්වහන්සේ කැමති බවයි. ඔබගේ කාර්යයන්, ඔබගේ පරීක්ෂාවන්, ඔබගේ තත්ත්වයන්, බාධාවක් යැයි ඔබ මැසිවිලි නගන ඒවා දෙවියන් වහන්සේට වඩා ශක්තිමත්ද .. ? ඔබ දෙවියන් වහන්සේ වෙතට පැමිණ ඔබ තුළ බැබළෙන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. උන්වහන්සේට එය කළ හැකි බවත්, ඇදහිලිවන්තයෙකු ලෙස ඔබට උන්වහන්සේගේ ප්‍රේමයේ ආලෝකය තුළ දවස පුරා සහ සෑම දිනකම ඇවිදීමට හැකි බවත් ඔබ දකිනු ඇත. එනම් සම්පූර්ණ ගැලවීම අත්දැකීම යන්නයි. ස්වාමීනී, මම කිසිවිටෙකත් එය නොදැන සිටියෙමි. එබැවින් මම එය භුක්ති නොවින්දෙමි. නමුත් දැන් එය කරමි කියා පවසන්න.

අසීමිත හවුල්කාරිත්වය

"මා සන්තක සියල්ල ද නුඹේය." වැඩිමහල් පුත්‍රයා තම සහෝදරයාව (අකීකරු පුත්‍රයාව) පියා කාරුණිකව පිළිගැනීම ගැන, සියලු සංග්‍රහයන් ගැන, ඔහු ආපසු පැමිණීම ගැන, ප්‍රීතිවීම පිළිබඳව පැමිණිලි කළේය. නමුත් ඔහුට කිසිවිටෙකත් තම මිතුරන් සමඟ විනෝදවීමට එළු පැටවෙකු ලබා දී නොතිබුණි. (ලූක් 15:29) පියා ඔහුගේ ආදරයේ මෘදු මොළොක් බවින් ඔහුට පිළිතුරු දෙමින් පුතේ ඔයා නිතරම මගේ නිවසේ සිටියා ඔබට තිබුණේ ඉල්ලීමට පමණක් වන අතර ඔබට අවශ්‍ය සියල්ල ලැබෙනු ඇත. අපගේ පියාණන් වහන්සේ උන්වහන්සේගේ සියලුම දරුවන්ට පවසන්නේ එයයි. නමුත් ඔබ පවසන්නේ මම දුර්වලයි, මගේ පව්වලින් ජය ගන්නට බැහැ. නිවැරදිව මට මාව කළමනාකරණය කර ගැනීමට මට බැහැ. මට මේ දේවල් කරන්නට බැහැ කියාය. මක්නිසාද දෙවියන් වහන්සේට සියල්ල පුළුවන උන්වහන්සේ සෑමවිටම පවසන්නේ මා සතු සියල්ල ඔබගේය. මක්නිසාද ක්‍රිස්තුස් වහන්සේ තුළ මම එය ඔබට දුනිමි. ආත්මයාණන් වහන්සේගේ ප්‍රඥාව සියලු බලය, ක්‍රිස්තුස් වහන්සේගේ සියලු

(ඇන්ඩ්‍රෑ මරේ විසිනි)

ධනය, පියාණන් වහන්සේගේ සම්පූර්ණ ප්‍රේමය ඇතුළු සියලු දේ ලබාදුන් සේක. මම ඔබට ප්‍රේම කරන ආශීර්වාද කරන දෙවියන් වහන්සේය. නමුත් සමහර අයට එය සිහිනයක් ලෙස පෙනෙන්නේ ඇයි.. ? ඔබ මෙතරම් දිළිඳුව සිටින්නේ ඇයි ..? දෙවියන් වහන්සේගේ වචනය විශ්වාසවන්තව තිබේ. උන්වහන්සේ මේ සියල්ල පොරොන්දු වී නොතිබෙන සේක්ද .. ? යොහාන් 14 සිට 16 දක්වා පරිච්ඡේද බලන්න. අපි යේසුස් වහන්සේගේ නාමයෙන් පැමිණ උන්වහන්සේ තුළ සිටියොත් යාච්ඤාවට පුදුමාකාර පිළිතුරු ලබාගත හැකි බව උන්වහන්සේ අපට පවසන ආකාරය බලන්න. කිතුණුවෙකුට එවැනි ජීවිතයක් ගතකළ හැකි බව අපි ඇත්තටම විශ්වාස කරනවාද .. ?

අත්දැකීම්වල අඩුකම

දැන් අපගේ දෙවන කාරණය සලකා බලමු. දෙවියන් වහන්සේගේ ප්‍රේමණීය දරුවන් බොහෝ දෙනෙකුගේ අත්දැකීම් අඩුය. එය කුමක්ද .. ? දිළිඳුකමේ සහ කුසගින්නේ පමණක් ජීවත්වෙන වැඩිමහල් පුතා ධනවත් දරුවෙක් නමුත් අන්ත දුප්පත්කමේ ජීවත්විය. කවදාවත් ඔහුට එළු පැටවෙකුවත් ලැබුණේ නැත. ඔහුගේ පියා සතු සියල්ල ඔහුගේ විය. දේව දරුවන් බොහෝ දෙනෙකුගේ තත්ත්වය මෙයයි. අප ජීවත්වීමට උන්වහන්සේට අවශ්‍ය ආකාරය උන්වහන්සේගේ පූර්ණ සහයෝගීතාවයෙන් යුක්ත වුවද අත්දැකීම් කොයිතරම් වෙනස්ද .. ? ඔවුන්ගේ ජීවිත සතුටින් පිරී තිබේද කියා සමහර අයගෙන් අහන්න. මක්නිසාද සෑමවිටම සතුටින් හා ශුද්ධව සිටිය හැකි යැයි ඔවුන් විශ්වාස කරන්නේවත් නැත. අපි මෙම කාර්යයන් තුළ ඉදිරියට යන්නේ කොහොමද .. ? කියා ඔවුහු අසති. ඔවුන්ට හැකි උපරිම ආශීර්වාදයේ ජීවිතය සුසුම්ලමින්, දුකෙන් හා ශෝකයෙන් වන්නේ යැයි ඔවුන් සිතති.

මම එක් ආදරණීය කිතුණු කාන්තාවකගෙන් ඇය ගමන් කරන්නේ කෙසේදැයි ඇසුවෙමි. ඇයගේ අත්දැකීම අනුව එය විටෙක ආලෝකය සහ විටෙක අඳුර බව ඇය පිළිතුරු දුන්නාය. මෙය ස්වභාවයෙන්ම එසේ වූ බැවින් කරුණාවේ රාජ්‍යය තුළ ද එයම යහපත් බව තර්ක කළාය. එබැවින් ඇය තමාව දුක්ඛිත (අසතුටුදායක) අත්දැකීමකට පමණක් අතහැර දමා තිබුණේය. නමුත් කිසිදු ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ අත්දැකීම රාත්‍රිය හෝ අඳුර බව මම බයිබලයේ කියවා නැත. නමුත් ඊට ප්‍රතිවිරුද්ධ අපි මෙලෙස කියවන්නෙමු. "**නුඹේ ඉර තවත් බැසයන්නේවත්, නුඹේ සඳපහව යන්නේවත් නැත. මක්නිසාද ස්වාමීන් වහන්සේ නුඹේ සදාකාල එළිය වන සේක. නුඹේ වැලපීමේ දවස් කෙළවර වන්නේය."** (යෙසායා 60:20) එහෙත් තමන්ට එතරම් යහපතක් නැතැයි සිතන බොහෝ දෙනෙක් සිටිති. මා දැනටමත් පවසා තිබෙන පරිදි පාපයට හා අවිශ්වාසයට හැර වෙන කිසිවකට දෙවියන් වහන්සේව අපෙන් සැඟවිය නොහැකිය. ඔබ ආත්මිකව බෙලහීනව (දරිද්‍රතාවයෙන්) සිටී නම් ප්‍රීතියක්ද පාපයට ඉහළින් ජයග්‍රහණය ලැබීමේ අත්දැකීමක්ද නැතිව නොරිස්සුම, වියවුල්කම ඇත්වන්නේ ඇයි .. ?

5 පිටුවට

4 පිටුවෙන්

පූර්ණ ගැලවීම අපගේ...

මම දුර්වලයි. මම වැටෙයි කියා ඔබ සිතන්නේය. ශුද්ධ ලියවිල්ලේ පවසන්නේ උන්වහන්සේ අපව වැටීමෙන් ආරක්ෂා කරගන්නා බවයි. **"ඉතින් නුඹලා නොඇකිලෙන ලෙස ආරක්ෂා කරන්ටත් මහත් ප්‍රීතියෙන් යුක්තව උන්වහන්සේගේ තේජස ඉදිරියෙහි කැළැල් රහිතව තබන්ටත් සමර්ථ වූ ...."** (යුදස් 1:24) දෙවියන් වහන්සේට හැකියාව තිබුණත්. උන්වහන්සේ එය කිරීමට කැමති බව එම පදයේ පවසන්නේ නැහැ කියා දේව සේවකයෙක් මට කීවේය. දෙවියන් වහන්සේ අපට සමච්චල් කරන්නේ නැත. ප්‍රේමණීය වූ දෙවියන් වහන්සේ **"හැකියයි"** පවසන්නේ නම් එය කිරීමට උන්වහන්සේගේ කැමැත්තට එය සාක්ෂියකි. අපි දේව වචනය විශ්වාස කර අපගේම අත්දැකීම් එහි ආලෝකයෙන් විමසා බලමු.

නැවතත් ඔබ දෙවියන් වහන්සේ උදෙසා වැඩ කරමින් බොහෝ පළ දරනවාද ..? ඔබගේ ජීවිතය දෙස බලන මනුෂ්‍යයන් දෙවියන් වහන්සේ ඒ මනුෂ්‍යයා සමඟ සිටි අතර ඔහු නිහතමානීව, පිරිසිදුව හා ස්වර්ගීක මනසක් ඇතුව සිටිනවා යැයි පවසනවාද ... ? එසේ නැති නම් ඔබ ඉතා සාමාන්‍ය කිතුණුවෙක් බවත්, පහසුවෙන් පෙළඹවිය හැකි බවත්, ලෞකික මනසක් ඇතිව සහ ස්වර්ගීක මනසක් නොමැතිව සිටින බවත් ප්‍රකාශ කිරීමට ඔවුන්ව යොමු කරනවාද .. ? දෙවියන් වහන්සේ අපෙන් බලාපොරොත්තු වන ජීවිතය එය නොවේ. අපට පොහොසත් පියෙක් සිටින අතර කිසිම සැබෑ භූමික පියෙකු තම දරුවා වැරහැළි වලින් හෝ නිසි ඇදුම් පැලඳුම් වලින් තොරව දැකීමට කැමති නැති අතර, අපගේ ස්වර්ගය පියාණන් වහන්සේ ඊට වඩා කොපමණ එයට අකමැතිව සිටිනවාද .. ? නමුත් උන්වහන්සේ අපගේ ජීවිතය පොහොසත්ම සහ හොඳම ආශිර්වාද වලින් පුරවාලීමට කැමැත්තෙන් සිටින සේක.

සබත් පාසැල් ගුරුවරුන් අතරේ කී දෙනෙක් උගන්වමින් ඔවුන්ගේ ශිෂ්‍යයන්ව දෙවියන් වහන්සේ වෙතට හැරවීමට බලාපොරොත්තු වුවත් ඔවුන් කිසිවෙකුට දෙවියන් වහන්සේ පාවිච්චි කරන බව කිව නොහැකිය. මක්නිසාද ඔවුන්ට දෙවියන් වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවයක් නොමැත. ඔවුන් පාපයෙන් ජයගෙන නැත. ලෝකයේ කාරණා ඒත්තු ගැන්වීමට බලයක් නැත. ඔබ අයත් වන්නේ පහත් මට්ටමේ කොටසටද .. ? නැති නම් සම්පූර්ණයෙන්ම අයිති කොටසටද .. ? අද ඒ ගැන පසුතැවිලි වෙන්න. මෙම පුතුන් දෙදෙනා කිතුණුවන්ගේ පන්ති දෙකක් නියෝජනය කරයි. වැඩිමහල් පුත්‍රයා පියාණන් වහන්සේ සමඟ පූර්ණ සම්බන්ධතාවයෙන් (ඇසුරෙන්) ඈත්ව සිටි අතර බාල පුත්‍රයා පැරණි නරක පුරුදු වලින් හැරී ඇවිත් සිටියෝය. ඔවුන් ඉතා දිළිඳුන් මෙන් සිටියෝය. වැඩිමහල් පුත්‍රයාටත්. බාල පුත්‍රයාට මෙන්ම විශාල වෙනස්වීමක් අවශ්‍යය විය. ඔහු වරද පිළිගෙන පසුතැවිලි වී ඔහුගේ සම්පූර්ණ වරප්‍රසාද ලබා ගැනීම අවශ්‍ය විය. ඒ නිසා සියලු දුර්වල මට්ටමේ සිටින කිතුණුවන් වරද පිළිගෙන පසුතැවිලි වී සම්පූර්ණ ගැලවීම හිමිකරගත යුතුය. මෙම කණ්ඩායම් දෙකටම අයිති කිතුණුවන් අද දවසේදී හැරී ඇවිත් පියාණෙනි...., මම පව්කලා කියා පැවසිය යුතුය.

මහා විෂමතාවයට හේතුව

දැන් අපි අවධානය යොමු කරන්නේ මේ මහා විෂමතාවයට හේතුව කුමක්ද කියායි. අත්දැකීම්වල විශාල වෙනසක් තිබෙන්නේ ඇයි ... ? මෙම සම්පූර්ණ ආශිර්වාදය භුක්ති නොවිඳීමට හේතුව කුමක්ද කියා ඔබගෙන්ම අසන්න. දෙවියන් වහන්සේගේ වචනය ඒ ගැන කතා කරන සේක. අනිත් අය ඒ ගැන කතා කරති. එමෙන්ම එලෙස ජීවත්වන සමහර අයව මම දකිමි. ඊට හේතුව අසන්න. දෙවියන් වහන්සේ වෙතට පැමිණ මෙසේ කියන්න. මම කවදාවත් ඔබවහන්සේ කැමති ජීවිතය ගත නොකරන්නේ ඇයි ..... ? අපි අවධානය යොමු කරන බයිබල් කථාවෙන් ඔබට පිළිතුරු සොයාගත හැකිය. වැඩිමහල් පුත්‍රයාට ළමයෙකුට වැනි ආත්මයක් තිබූ අතර ඔශුට ඔහුගේ පියා ගැන වැරදි සිතුවිලි ඇතිවී තිබුණි. එම නිසා ඔබ ඔබගේ පියාණන් වහන්සේගේ සැබෑ චරිතය දැන සිටියේ නම් ඔබගේ ජීවිතය යහපත් වනු ඇත. වැඩිමහල් පුත්‍රයා කිව්වාක් මෙන් මට කවදාවත් සතුටුවෙන්න එළු පැටියෙක්වත් දුන්නේ නැහැ කියා කියනවාද .. ? මගේ පියා පොහොසත් ඒක කවදාවත් මට දෙන්නෙ නැහැ. මම හොඳට යාච්ඤා කළා. නමුත් දෙවියන් වහන්සේ මට උත්තර දෙන්නෙ නැහැ. දෙවියන් වහන්සේගෙන් පූර්ණ වුනා කියලා අනිත් අය කියනවා මට ඇහෙනවා. උන්වහන්සේ ඔවුන්ව තෘප්තියට පමුණුවනවා. ඒත් උන්වහන්සේ කවදාවත් මා වෙනුවෙන් එය කරන්නේ නැහැ කියා කියනවාද .. ?

හිතවත් දේව සේවකයෙක් වරක් මට පැවසුවේ එවැනි ජීවිතයක් සෑම කෙනෙකුටම නොවන බවත්, එය තමන් වහන්සේ කැමති කෙනෙකුට ලබාදීම දෙවියන් වහන්සේගේ ස්වාධිපත්‍ය බවත්ය. මිත්‍රවරුණි, දෙවියන් වහන්සේගේ පරමාධිපත්‍යය ගැන කිසිදු සැකයක් නැත. උන්වහන්සේ කැමති පරිදි උන්වහන්සේගේ දීමනා ලබාදෙන සේක. අපි සියල්ලෝම පාවලු හෝ ප්‍රේත්‍රැස් නොවේ. දෙවියන් වහන්සේගේ දකුණු හා වම්පැත්තේ ස්ථාන උන්වහන්සේ කැමති ඕනෑම කෙනෙකුට සූදානම් කර ඇත. නමුත් මෙය දිව්‍ය ආධිපත්‍යය පිළිබඳ කාරණයක් නොවේ. එය දරුකමේ උරුමය පිළිබඳ ප්‍රශ්නයකි. පියාණන් වහන්සේගේ සැබෑ ආදරය අත්දැකීමෙන් සෑම දේව දරුවෙකුටම උන්වහන්සේගේ සම්පූර්ණ ගැලවීම ලබාදෙන සේක.

දැන් භූමික පියෙක් දෙස බලන්න. ඔහුගේ දරුවන් විවිධ වයස්වල පසුවන නමුත් තම පියාගේ මුහුණේ ප්‍රීතියට සෑම දරුවෙකුටම අයිතියක් ඇත. ඔහු අවුරුදු විස්සක පුතාට අවුරුදු පහක පුතාට වඩා වැඩි මුදලක් ලබාදිය හැකිය. තුන් හැවිරිදි දරුවාට වඩා පහළොස් අවුරුදු දරුවාට කථා කිරීමට පියාට බොහෝ දේ තිබේ. නමුත් ඔවුන් කෙරෙහි දක්වන ප්‍රේමය සම්බන්ධයෙන් ගත් කළ ඒ සියල්ල එක හා සමාන වන අතර දරුවන් ලෙස ඔවුන්ගේ වරප්‍රසාදවලදී ඔවුන් සියල්ලෝම එක හා සමානය.

දෙවියන් වහන්සේ තම ප්‍රේමණීය දරුවන් සියල්ලන්ටම දක්වන ආදරය එක හා සමානය. දෙවියන් වහන්සේට දොස් පැවරීමට උත්සාහ නොකරන්න. නමුත් දෙවියන් වහන්ස ..., ඔබ වහන්සේ ගැන මට දැඩි සිතුවිලි ඇතිවුණා, දෙවියන් වහන්ස, මම පව් කළා කියා කියන්න. භූමික පියෙක් තම දරුවන් ගැන කරන දේට වඩා දේ ස්වර්ගීය පියාණන් වහන්සේට කළ හැකි බව මම විශ්වාස නොකළෙමි. ඔබවහන්සේ මා වෙනුවෙන් ක්‍රියා කිරීමට කැමැත්තෙන් සිටින අතර මා තුළ ඇදහිල්ල අඩු වී ඇත. ඔබට සම්පූර්ණ ගැලවීම ලබාදෙන පිණිස දෙවියන් වහන්සේගේ ආදරය කැමැත්ත සහ බලය විශ්වාස කරන්න. වෙනසක් අනිවාර්යයෙන්ම පැමිණිය යුතුය.

නැවත ගොඩනැගීමේ ක්‍රියා මාර්ගය

දැන් අපි නැවත යථාතත්වයට පත්කිරීමේ ක්‍රියාමාර්ගය ගැන සලකා බලමු. ඉහතින් කී දුර්වල අත්දැකීම වලින් මිදෙන්නේ කෙසේද .. ? අකීකරු පුත්‍රයන් පසුතැවිලි විය යුතු අතර ඔවුන්ගේ පොරොන්දු දුටු නමුත් ප්‍රීතියෙන් තොරව ජීවත් වූ දෙවියන් වහන්සේගේ දරුවන්ද එසේම පසුතැවිලි විය යුතුය. පසුතැවිලිවීම සාමාන්‍යයෙන් ඉක්මනින් (ක්ෂණිකව) සිදුවන අතර දිගු පසුතැවිලිවීමක් සාමාන්‍යයෙන් බොහෝ කල් සමාව නොගැනීමක් ප්‍රකාශවේ. ක්‍රිස්තුස් වහන්සේගේ සභාවේ බොහෝ දෙනෙක් සිතන්නේ සම්පූර්ණ ගැලවීම ලැබීමට බොහෝ කාලයක් ගතවිය යුතු බවයි. ඔව් ..., ඔබගේ ජීවිතය තුළ ඔබට එය කිරීමට නම් බොහෝ කාලයක් ගතවනු ඇත. ඇත්ත වශයෙන්ම කිසිවිටෙකත් එය එසේ නොවෙයි. ඔබ ඇවිත් දෙවියන් වහන්සේව විශ්වාස කළොත් එක මොහොතකින් එය කළ හැකිය. දෙවියන් වහන්සේගේ කරුණාව කරුණුකොටගෙන ඔබගේ ජීවිතය උන්වහන්සේට භාරදෙන්න. එයින් ඇති ප්‍රයෝජනය කුමක්ද .. ? එයින් යහපතක් සිදු නොවේ කියා නොපවසන්න. නමුත් ඔබගේ ජීවිතය ඔබගේ දුර්වලකම්, ඔබගේ පාපය, උන්වහන්සේ වෙතට ගෙන එන්න. දෙවියන් වහන්සේ එයින් ඔබව මුදාගනු ලබන සේක. එය අන්ධකාරයෙන් ආලෝකයට එක් පියවරක් පමණක් බව ඔබ දකිනු ඇත. පියාණෙනි, ඔබ සමඟ සිටියත්, ඔබ මා කෙරෙහි දක්වන ආදරය විශ්වාස නොකිරීමෙන් මම මොනතරම් දුක්ඛිත තත්ත්වයකට පත්ව සිටිනවාද .. ?

මම අද දවසේ පසුතැවිලි වෙන්න කියා කැඳවන්නේ ගැලවීම නොලැබූ අයට නොව, නමුත් නිදහස් විය යුත්තේ කුමකින් දැයි දන්නා අයටයි. මක්නිසාද ඔබ දෙවියන් වහන්සේට විරුද්ධව දැඩි සිතුවිල්ලෙන් පව් නොකළ නමුත් වඩා යහපත් දේ උදෙසා පිපාසයක්, ආශාවක් නොමැතිද ... ? ඇවිත් පසුතැවිලිවීම කරුණුකොටගෙන දෙවියන් වහන්සේ ඔබගේ අවිශ්වාසයකමේ පාපය මකා දමන බව ඔබ විශ්වාස කරනවාද ... ? අවිශ්වාසයෙන් දෙවියන් වහන්සේට අගෞරව නොකරන්න. නමුත් අද පැමිණ සම්පූර්ණ ගැලවීම විශ්වාස කරන්න. ඊළඟට ඔබව දෙවියන් වහන්සේ තුළ රඳවා තබා ගැනීමට උන්වහන්සේට හැකි බව විශ්වාස කරන්න. සමහරුන්ට මෙය අපහසු බව පෙනේ. නමුත් එහි කිසිදු දුෂ්කරතාවයක් නොමැත. "පුතා ඔයා සැමදාම මා සමඟයි." කියා දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ ආලෝකය ඔබ මත බබළවන සේක. ඔබ කළ යුත්තේ එම ආලෝකය තුළ පැවතීම සහ ඇවිදයාම පමණි.

කිතුණුවන්ගේ කණ්ඩායම් දෙකක් තිබේ. එනම් සම්පූර්ණ ගැලවීම භුක්තිවිඳින අය සහ ඒ ගැන අවබෝධයක් නැති අයයි. එය ඔබට පැහැදිලි නැතිනම් පැහැදිලි කරදෙන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටින්න. නමුත් එය තේරුම්ගන්නේ නම් එය නිශ්චිත ක්‍රියාවක් බව මතක තබාගන්න. ඔබගේ ජීවිතය දෙවියන් වහන්සේගේ දැත්වලට භාර කිරීමට ඉඩදෙන්න. "සියල්ල ඔබගේය" කියා උන්වහන්සේ පවසනවා අසන්න. එවිට දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන්න. මම විශ්වාස කරනවා. මම පිළිගන්නවා. මම මගේ ජීවිතය උන්වහන්සේට භාරදෙනවා. දෙවියන් වහන්සේ සියල්ල මට ලබාදෙන බව මම විශ්වාස කරනවා කියා ඔබ පවසනවා ඇත.

"මාගේ පියාණෙනි...., ඔබගේ සම්පූර්ණ ගැලවීමේ පූර්ණ භුක්තියට මාව ගෙන එන්න. "

"සියලු යාච්ඤාවලින්ද, ඉල්ලීම්වලින්ද සියලු කාලවලදී ආත්මයාණන් කරුණු කොටගෙන යාච්ඤා කරපල්ලා." (එපීස 6:18)

කැපකිරීමේ ගිවිසුමක්

වේල්සයේ "ජෝන් බුනියන්ව" බොහෝ විට ක්‍රිස්මන් එමන්ස් ලෙස හඳුන්වනු ලැබූ අතර ඔහු වසර ගණනාවක් දේශනා කිරීමෙන් පසු දෙවියන් වහන්සේ සමඟ සමීප ඇසුරක් සඳහා දැඩි අවශ්‍යතාවයක් සහ ආශාවක් දැනෙන්නට පටන් ගත්තේය. දිව්‍ය ප්‍රකාශයෙන් ඔහුගේ ආත්මය ගිණිබත් කළ මෙම පොහොසත් සම්පූර්ණ ක්‍රිස්තියානි අත්දැකීම ඔහු සොයමින් සහ ලබාගත් ආකාරය ඔහුගේම වචන වලින් මෙසේ දක්වා ඇත.

ශීතලව වෙහෙසට පත්ව සිටිය මගේ හදවත ක්‍රිස්තුස් වහන්සේගේ අභියසදී උන්වහන්සේගේ සමාවදීම සහ උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ ක්‍රියාකිරීම ඇති විය. දේශනා කුඩුවේදී රහසිගත යාච්ඤාවේදී සහ බයිබලය අධ්‍යනයේදී යාච්ඤා කිරීම මගේ යුතුකමක් බව මට හැගුණි. මගේ හදවත දැඩිව තිබූ අතර මගේ ආත්මය ලොකික විය. මම යේසුස් වහන්සේගේ නාමයෙන් යාච්ඤා කිරීමට පටන්ගත් පසු මට ඉක්මනින්ම දැණුනේ විලංගු කඩා වැටෙන්නාක් මෙන් සහ හිම සහ අයිස් කදු මා තළ දියවී යනවා වැනිය. මෙය ශුද්ධාත්මයාණන් වහන්සේගේ පොරොන්දුව සඳහා මාගේ මනසේ විශ්වාසයක් ඇති කළේය.

මා මුළු මහත් බැදීමකින් නිදහස් වෙන බවක් මට දැණුනි. එය දරුණු ශීත සෘතුවේ සොහොනින් නැගිටිනවාක් මෙන් විය. මාගේ කඳුළු බොහෝ සේ ගලා ගිය අතර මම මහත් හඬකින් අඬමින් උන්වහන්සේ මා යටතේ තබා තිබූ දේවස්ථාන වෙතට උන්වහන්සේගේ කරුණාවන්ත පැමිණීම සිදුකරමින් ගැලවීමේ ප්‍රීතිය ලැබීම සඳහා යාච්ඤා කිරීමට පෙළඹුනෙමි. මේ අනුව මම මගේ ශරීරය, ආත්මය, කුසලතා, ශ්‍රමය, මගේ මුළු ජීවිතයම සෑමදිනකම ඉතිරි වූ සෑම පැයක්ම සහ මගේ මුළු සැලකිල්ල ක්‍රිස්තුස් වහන්සේ අතට භාරදුනිමි.

මෙයින් පසු මා විසින් පවත්වන ලද පළමු දේව මෙහෙයේදී මා හට හැගුණේ මම සීතල සහ වදවූ ආත්මික අයිස් සහිත ප්‍රදේශයෙන් දෙවියන් වහන්සේගේ පොරොන්දු වූ ප්‍රසන්න දේශය වෙතට පිටත්ව අවිත් සිටින්නාක් මෙන්ය. මම ආපසු නිවසට පැමිණි විට පළමුවෙන්ම මගේ අවධානයට ලක් වූ දෙය නම් ආත්මයාණන් වහන්සේ ඇන්ග්ලීසියේ සහෝදරයන් තුළ ක්‍රියාකරමින්, ඔවුන් තුළ යාච්ඤාවේ ආත්මයක් වගුරුවමින්, විශේෂයෙන් දෙවියන් වහන්සේ ආලේප කළ උපස්ථාදායකයින් දෙදෙනෙක් තුලින් පව්කාරියින්ව ගැලවීම වෙතට හරවා ගැනීමේදී උන්වහන්සේගේ කරුණාවේ වචනය බලපෑමකින් යුක්තව අප අතරෙහි ක්‍රියාත්මක වූ බවයි.

දේශකයන් තුළින් මහා පිඹීදීමක් වේල්සය පුරා පැතිරී ගියේය. බලවත් දේශනා, ස්වර්ගයේ හුස්ම, හැඩීම , ප්‍රශංසා කිරීම, පව්කාරයන් දෙවියන් වහන්සේ වෙතට හැරී පැමිණීම දැන් එවන්ස් ගිය ගිය සෑම තැනකම රැස්වීම්වල ලක්ෂණය විය. දෙවියන් වහන්සේ සමඟ ශුද්ධාත්මයාණන් වහන්සේගේ අද්විතීය වූ ආලේපයේ අත්දැකීම පිළිබඳව මේ කාලයේ දී එවන්ස් මෙසේ ලියනු ලැබීය. "අනුගාමිකයන්ට දෙවියන් වහන්සේ සමඟ උදාර ගිවිසුමක් ඇත."

දෙවියන් වහන්සේ සමඟ උදාරවූ ගිවිසුම

මම ඔබවහන්සේට මාගේ ආත්මය සහ ශරීරය භාරදෙමි. යේසුස් වහන්ස..., සැබෑ වූ දෙවියන් වහන්ස ..., පාපයෙන්ද, සදාකාල මරණයෙන්ද මාව ගලවා සදාකාල ජීවනයට මාව ගෙනයන්න. අමේන් ....!

සූර්යයා , පොළොව, ගස් සහ සියලු දේ මාව ඔබවහන්සේ කැඳවන දවසේදී මම ඔබ වෙතට පැමිණෙන බවට සාක්ෂි දරයි. පව්කරුවන්ගේ මිදුම්කාරයාණෙනි, වරදකාරීත්වයේ ගිගුරුම් සහ සදාකාලික බියෙන් මගේ ආත්මයට විවේක දුන මැනව. ආමේන්..!

මම ඔබට ප්‍රේමකරන පිණිස ඔබගේ බලය කෙරෙහි විශ්වාසය ඇතිව සිටීමට චර්මච්ඡේදනය වූ හදවතක් මට ලබාදෙන ලෙසත් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමි. මම ඔබගේ මහිමය සොයන පිණිස නිවැරදි ආත්මයක් මා තුළ නිර්මාණය කළ මැනව. විනිශ්චය දවසේදී ඔබ සතු එම සත්‍යතාවයන් මට ලබාදෙන්න. මාගේ මුහුණ මලානිකව නොතිබෙන පිණිස, මම කුහකයෙකු ලෙස පෙනී නොසිටින පිනිස ඔබගේ අනර්ඝ වූ ලේ වලින් මාව පවිත්‍ර කළ මැනව..., ආමේන් ... !

දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන යේසුස් වහන්ස..., ඔබගේ මරණය සහ පවිත්‍ර කරන ඔබගේ ගිවිසුමේ ලේ ගැන ගිවිසුමේ උදේයෝගයක් මට ලබා දෙන මෙන් ඉතා ඕනෑකමින් ආයාචනා කරමින් ඉල්ලා සිටින්නෙමි. ඔබගේ ධර්මිෂ්ඨකම තුළ එය යුක්ති සහගත කරනු ලබයි. මුදාහරිනු ලබන ඔබගේ මිදීම තුළ මනුෂ්‍යයන්ට දුන් ඔබගේ නාමයෙන් ඔබගේ ලේ නිසාත් උද්යෝගයෙන් ඉල්ලා සිටිමි..., ආමේන් ... !

ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස් වහන්ස, මාගේ කාලය, ශක්තිය, මා සතු දීමනා, කුසලතා, ඔබගේ මරණය වෙනුවෙන් පූජාකර ලෝකයේ ඔබගේ සභාව ගොඩනැගීමේදී හදවතේ සම්පූර්ණ අරමුණ ඇතිව මම ඔබගේ මහිමයට කැප කරමි. මක්නිසාද ඔබ මනුෂ්‍යයන්ගේ දක්ෂතාවයන්වලට වටිනාකමක් ඇති කරන සේක. ආමේන් ...!

මාගේ ශ්‍රේෂ්ඨ උත්තම පූජකයාණෙනි, ඔබගේ ශ්‍රේෂ්ඨාධිකරණයේ බලයෙන් දේශකයෙකු වශයෙන් මාව පාවිච්චි කිරීමට ද කිතුණුවෙකු වශයෙන් මාගේ භක්තිවන්කමද, එකිනෙකට ආසන්නයේ තිබෙන උද්‍යාන දෙකක් මෙන් මම ඔබට කැප කරමි. ඔබගේ ධර්මිෂ්ඨකම කෙරෙහි මාගේ විශ්වාසය වැළැක්වීමට පාපයට මාගේ හදවතේ ඉඩක් නොතිබෙනු ඇත. මට දී ඇති දීමනා වියලීයාමට ඉඩ සලසන කිසිම අනුවන ක්‍රියාවකට ඉඩ නොතබමි. මාගේ ජීවිතය අවසන්වීමට පෙර මා නිශ්චල නොවන පිණිසත් ඔබගේ කරුණාවන්ත දෑස් මා කෙරෙහි තබා මාගේ ස්වාමීනි..., මාගේ දෙවියන් වහන්ස.., සදාකාලයටම මා ගැන බලාගන්න. ආමේන් .... !

මාගේ සමාදානයට හානි නොවන පිණිස ඔබගේ නාමයට හානියක් හෝ අපහාසයක් සිදු නොවන පිණිස බොහෝ දෙනා පැකිලෙන

(ජේම්ස ග්‍රිල්ක්‍රිස්ට් ලෝසන් විසිනි)

වැටීම්වලින් ආරක්ෂාවීමට ගැලවුම්කරුවාණන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේට ජීවිතය භාරදෙමි. ඔබගේ සෙනඟ ශෝකයට පත්නොවන පිණිසත්, ඔබේ සතුරන් දැඩි නොවන පිණිසත් අපි එසේ කරන්නෙමු. ආමේන් .. !

මාගේ දේවසේවයේදී මා සමඟ ගිවිසුමකට එළඹෙන ලෙස මම ඔබගෙන් ඉල්ලා සිටින්නෙමි. ඔබවහන්සේ බුන්යන්, වාවසෝර්, පාවෙල්, හොවෙල්, හැරිස්, රෝලන්ඩ් සහ වයිට්ෆීල්ඩ් සමෘද්ධිමත් කලාක් මෙන් මාවත් සමෘද්ධිමත් කළ මැනව. මාගේ සෞභාග්‍යයට ඇති බාධා ඉවත්වේ. මෙය ඉටුකරගන්නා පිණිස දෙවියන් වහන්සේ කැමති දේ මා තුළ ඉටුකරන්න. ඔබ වහන්සේටත්, මනුෂ්‍යයන්ටත් ප්‍රේම කිරීමට හැකි හදවතක් මට ලබාදෙන්න. ඔබගේ වචනය දේශනා කිරීමට පෙර එහි බලය දැනගන්නට මට ඉඩදෙන්න. මිසරයේ ගොඩබිමට සහ ජලයට මෝසෙස්ගේ සැරයැටියේ බලපෑම දැනෙන්නට පෙර මෝසෙස්ට එහි බලය දැණුනාක් මෙන් ඔබගේ අනර්ඝ රුධිරය වෙනුවෙන් යේසුස් වහන්ස.., මට මෙය ලබාදෙන්න. ආමේන් .. !

දැන් මා සෝදිසි කර විනිශ්චයේ මාවත්වල ගෙන ගිය මැනව සදාකාලික ආලෝකය මා වෙත පැමිණෙන විට ඔබවහන්සේ ලෝකය දකින ආකාරයෙන් දැකීමට මට හැකිවේ. සදාකාලික දීප්තියෙන් මම මාගේ දෑස් විවෘත කරමි. ඔබගේ රුධිරයෙන් මා සේදුව මැනව.., ආමේන් ... !

ආහාර සහ ඇඳුම් පැළඳුම් සඳහා ඔබ කෙරෙහි විශ්වාසය තැබීමටත් මාගේ ඉල්ලීම් ඔබ වහන්සේට දැනුම්දීමටත් මට බලය දෙන්න. ඔබේ රුකවරණය ඔබ සහ මා අතරේ ගිවිසුමේ වරප්‍රසාදයක් ලෙස මා කෙරෙහි පවතීවා. ආකාශයේ පක්ෂීන් පෝෂණය කරන්නාක් මෙන් සහ උදුනට දමන මානෙල් මල්වලට දක්වන සාමාන්‍යය රැකවරණයක් ලෙස නොව ඔබවහන්සේගේ පවුලේ සහ සහෝදරයන්ගෙන් කෙනෙක් මෙන් මාව මතකයේ තබාගන්න. ආමේන් .... !

ස්වාමීන් වහන්ස ..., එලීගේ පුත්‍රයන් මෙන් ඔබවහන්සේගේ ශුද්ධස්ථානයේ වැඩ වලින් මාව නෙරපීමට හේතුවන කිසිම පාපයක් මා තුළ පෝෂණය වන්නට ඉඩ හැරිය මැනව. මාගේ ප්‍රයෝජනයට වඩා ඔබවහන්සේගේ ක්‍රියාවන් උදෙසා මගේ දවස් දිගුවේවා. මාගේ කාලය අවසානයේ දී අනිත් අයගේ ප්‍රයෝජනය සඳහා ක්‍රියාකිරීමට නොහැකි දැව කැබැල්ලක් මෙන් නොවේවා. ආමේන් ... !

මාගේ මිදුම්කරුවාණෙනි..., මාගේ මෙම කන්නලව් පියාණන් වහන්සේ ඉදිරියෙහි ඉදිරිපත් කරන මෙන් ඔබවහන්සේගෙන් අයැද සිටිමි. ඒවා ඔබගේම අමරණීය පැනෙන් ඔබගේ පොතෙහි සටහන් කර ගත මැනව. මම ඒවා මාගේ මරණයට පත්වන අත්වලින් පොළොවේ මාගේ පොතේ ලියන අතර ඔබගේ යහපත්කමට අනුව ඔබගේ අසීමිත කරුණාව සහ ඔබගේ අනුකම්පාව, ඔබගේ සෙනඟ කෙරෙහි ඔබගේ මෘදු මොළොක් බව අනුව මාගේ නිහතමානී යාච්ඤාවලට ඔබගේ නාමය සම්බන්ධ කළ මැනව. ආමේන් .. !

"ගෝලයෝ වනාහී ප්‍රීතියෙන්ද, ශුද්ධාත්මයෙන්ද පූර්ණ වූහ., (ක්‍රියා 13:52)

ජේ. හඩ්සන් ටේලර් (1832-1905) දෙවියන් වහන්සේ වෙනුවෙන් චීනයට - (දෙවන කොටස)

(හාවර්ඩ් ටේලර් විසිනි)

ජේ. හඩ්සන් ටේලර්, ඔහුගේ බිරිඳ සහ දරුවන් 1866 මැයි මාසයේ දී බ්‍රිතාන්‍යයේ සිට චීනය බලා පිටත්ව ගිය අතර එහි ඔවුන් මීට පෙර වසර හතක් මිෂනාරිවරුන් ලෙස සේවය කර ඇත. ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය මත නැවත එංගලන්තයට පැමිණි ටේලර් මහතාට දැන් දැණුනේ චීනයේ අභ්‍යන්තර පළාත්වල නැතිවි සිටින අය වෙත ළඟාවීමට ඔහුගේ හදවතට බරක්දී නැවත කැඳවනු ලැබීමයි. ඔවුන් සමඟ "චයිනා ඉන්ලන්ඩ්" මිෂන් සමඟ සේවය කිරීම සඳහා අලුත් මිෂනාරිවරුන් දහසය දෙනෙකු බඳවා ගන්නා ලදි.

ටයිෆුන්

ඔවුන් චීනයේ වෙරළට ළඟාවන තෙක් දිගු ගමන තරමක් හොඳින් සිදු විය. ඉන්පසු දින පහලොවක් පුරා කුඩා නැව ටටිෆුන් වලට (කුණාටුවට) හසු වූ අතර ඔවුන්ව ගමන් මාර්ගයෙන් ඉවතට ගසාගෙන යන ලදි. බොහෝ නාවිකයන් රෝගාතුර විය. නැව දුර්වල විය. නැව පැද්දීම නිසා ඇදුම් තෙත්වීමෙන් මිෂනාරිවරු විවේකයක් නොමැතිව වෙහෙසට පත්විය. පහලොස්වන දින කුණාටුව දරුණු විය. නැවේ ප්‍රධාන රුවල කැලිවලට ඉරී කුඹගස් කැඩී ගියේය. නැව ජලය මත පාලනයකින් තොරව පාවෙමින් තිබුණේය. කපිතාන්වරයාට පවා නැව බේරා ගැනීමේ බලාපොරොත්තු සුන් විය. කුණාටුව පුරාවටම ටේලර් මහතා සන්සුන්ව සිටියේය. ඔහු තම බලාපොරොත්තු වූ දෙවියන් වහන්සේ මත රැඳී සිටියේය. අර්බුදය උග්‍ර වූ විට ඔහු කපිතාන්වරයා සහ බලාපොරොත්තු සුන්වූ නැවේ කාර්යමණ්ඩලය වෙත ගොස් ඔවුන්ට සහතික ලෙස බලාපොරොත්තුවක් ලබා දුන්නේය. ඔහු සුන්බුන් ඉවත් කිරීමට සහ ඔවුන්ව බේරා ගැනීමට කළ හැකි දේ කිරීමට පටන් ගත්තේය. මිෂනාරිවරුන් ඔවුන්ගේ උපකාරයත් ලබා දුන්නෝය. ඔවුන් එකට වැඩ කිරීමෙන් නැව මුහුදු පතුලට පහසුවෙන් යා හැකි අර්බුදයෙන් මිදුණේය. මිෂනාරිවරුන් මනෂ්‍යාගේ අසරණභාවයේ දී සහ අනතුරේ පැයකදී දෙවියන් වහන්සේව විශ්වාස කිරීමේ ආශිර්වාදය පිළිබඳ පාඩමක් ඉගෙනගත්තේය. ටේලර් මහත්මිය මෙම පීඩාව ගැන මෙසේ ලියුවාය. "නුමුත් දෙවියන් වහන්සේ තුළ ප්‍රීතිවීමත්, වර්තමාන තත්ත්වයන්ගෙන් නිදහස්ව උන්වහන්සේගේ ප්‍රේමයේ අතීත සාක්ෂි මත විවේක ගැනීමත් මිහිරිවිය. පෙර නොවූ විරූ ලෙස මම හබක්කුක්ගේ ගීතයට පිවිසුනෙමි. එහෙත් මම ප්‍රීතිවන්නෙමි. ස්වාමීන් වහන්සේ තුළ මාගේ ගැලවීමේ දෙවියන් වහන්සේ තුළ මහිමවත් වන්නෙමි. "

චීනයට පැමිණීම

අවසානයේ දී කුණාටුවෙන් බැට කෑ නැව ෂැංහයි නගරයට අපහසුවෙන් ළඟාවිය. ආශ්චර්යමත් ලෙස සියලු පාර්ශවයන්ට එකට සිටීමට නවාතැන් සොයාගන්නා ලද අතර එහිදී ඔවුන් මුහුදේ ජලයෙන් පෙගුණු ගමන් මළු වියලීමට සහ නැවත අසුරාගෙන රට අභ්‍යන්තරයට යාමට සූදානම් විය. ඔවුන්ගේ කණ්ඩායමෙන් එක් අයෙක් මෙසේ ලිවීය. "අපි අපගේ ජීවිතවල අසරණව සිටියෙමු.

නමුත් අපව මෙහෙයවනු ලබන්නේ විවෘත කරන සහ කිසිවෙකු වසා නොයන අත බව අපි දැන සිටියෙමු." ෂැංහයි හී අප වෙනුවෙන් ආගන්තුක සත්කාරයට වහළක් සහ අපගේ යහපත සඳහා අපගේ භාණ්ඩවලට ගබඩා පහසුකම් ලබාදීම නිසා කිසිම සැකයක් නැතිව යාච්ඤා කර අපි ඉදිරියට ගියෙමු. පැමිණ මාස හයක් ඇතුළත නව මිෂනාරිවරුන්ගේ සියලුම පාර්ශව චීනයේ අභ්‍යන්තරයේ පදිංචි විය. මෙය මහත් ප්‍රීතියට හේතු වූ අතර යාච්ඤාවට ලැබුණු විශිෂ්ඨ පිළිතුරක් ලෙස පිළිගැණුනි.

මිෂනාරිවරුන් දණින් වැටී යාච්ඤා කරමින් සිටියා පමණක් නොව, එහි ධර්මදූත කටයුතු භාරව සිටි බර්ගර් මහතා නිවසේදී යාච්ඤා රැස්වීම් පත්වමින් සිටියේය. මීට අමතරව චීනයේ අභ්‍යන්තර දූත මෙහෙවර සඳහා යාච්ඤා කිරීමේ විශේෂ බර සමඟ තවත් යාච්ඤා රැස්වීම් ගණනාවක් බ්‍රිතාන්‍ය පුරා පැන නැගී තිබුණි.

මෙම කණ්ඩායම් චීනයේ වසරක් ගතකළ අවස්ථාව වන විට ඔවුන් තමන්ගේ ස්ථාන ගණන වැඩිකරගෙන තිබුණි. ඔවුන් පිහිටවනු ලැබූ පළමුවන නවාතැනේ සිට රට අභ්‍යන්තරයේ ඇති දුරම නවාතැනට දින විසිහතරකින් ගමන් කළ හැකි විය. මුහුදු වෙරළෙන් ඇතින් පිහිටි මෙම විශාල ප්‍රදේශයේ එකම මිෂනාරි කණ්ඩායම වූයේ ඔවුන්ය. මෙම පුරෝගාමී සේවය ඉතා දුෂ්කර වූ අතර බොහෝ මිෂනාරිවරුන් තරුණ වයසේ පසුවිය. යාච්ඤා රැස්වීම් මිෂනාරි සේවය සඳහා ඉතා වැදගත් විය. අන්ධකාරයේ බලය සැබවින්ම පැවති අතර ඒවා ජය ගැනීමට ඇති එකම මාර්ගය යාච්ඤාවයි. අවශ්‍ය දේ ප්‍රමාණවත්ව නොතිබුණු බව හැගුණු මිෂනාරිවරුන් දෙවියන් වහන්සේගේ ප්‍රමාණවත් බව සඳහා නිරතුරුවම උන්වහන්සේව සෙවූ අතර ටේලර්වරුන්ගේ ඇදහිල්ල, ස්ථීරභාවය සහ ශුද්ධ වූ නිර්භීතකම මගින් මහත්සේ උපකාර කරන ලදි.

අපගේ බර දෙවියන් වහන්සේට පිහාටු මෙන්ය.

නිතර රට මැද දුරස්තර ස්ථානවලට සංචාරය කිරීමට සිදු වූ නිසා ටේලර් මහතාට නිවසෙන් සහ පවුලෙන් වෙන්ව සිටීමට සිදු විය. මෙම වෙන්ව සිටීම දරා ගැනීම පහසු වූයේ නැත. වරක් ටේලර් මහත්මිය තම සැමියාගෙන් සති කිහිපයකට වෙන්ව සිටියදී ඔවුන්ගේ දරුවා දැඩි ලෙස රෝගාතුර විය. මෙම දුෂ්කරතාවයට මැදිව සිටි ටේලර් මහත්මිය ඇගේ ස්වාමිපුරුෂයාට මෙසේ ලියා යැවීය. "අපේ සියලු බර අපි අපේ සර්ව බලධාරි, සර්ව ප්‍රඥාවන්ත ප්‍රේමණීය පියා මත තැබුවෙමු. ඒවා බොහෝ බරින් යුක්තය. නමුත් උන්වහන්සේට එවා පිහාටු මෙනි. "

තවත් අවස්ථාවක දරුණු ලෙස රෝගාතුර වූ තම සැමියා මුණගැසීමට ඇයට බොහෝ දුරක් ගමන් කිරීමට සිදුවිය. අපගේ ගමනේ හදිස්සි බව නිසා බෝට්ටුකරුට හබල් අතහැරෙන තුරු වෙහෙසට පත්වෙමින් බෝට්ටුව පැදීමට සිදු විය. බෝට්ටුකරු විවේකගන්නා අතර තුර ටේලර් මහත්මිය දිවා රෑ නොබලා උෂ්ණය සහ කොන්දෙ කැක්කුම මැදින් ඔරු පැදීමෙන් තම ස්වාමිපුරුෂයා වෙත ළඟාවීමට සහ ඔහුට අවශ්‍ය උපකාර ලබාදීමට ක්‍රියා කළේය. ටේලර් මහතාට සාත්තු සප්පායම් කිරීමට හැකි වූයේ මෙම කුඩා කාන්තාව ඇගේ ගමනේ අවසානය දක්වා රැගෙන ගිය ඇදහිල්ල සහ යාච්ඤාව තුලින් පමණි.

විරුද්ධවාදීන්

දේවානුභාවයෙන් යුතුව අන්ධකාරයට ගොදුරුවී සිටිය අයට යේසුස් වහන්සේ ගැන කියන්නට පැමිණි මෙම විදේශිකයන්ට එරෙහිව චීන ජනතාව ඇවිස්සූ අය සිටියෝය. මිත්‍රශීලී අමුත්තන් වෙනුවට මිෂනාරි නිල නිවාසය වටා රැස්වූ තර්ජනාත්මක කණ්ඩායම් බිහි විය. ටේලර්වරුන්ගේ සහ එම කණ්ඩායමේ අනිත් මිෂනාරිවරුන්ගේ නිවාස වටා කැරළිකරුවන් දහස් ගණනක් එක් රැස්වූ ඉතා තීරණාත්මක කාලය පැමුණුනේය.

මුලදී ටේලර් මහතාට ඔහුගේ කාරුණික වචන වලින් ඔවුන්ව සනසන්නට හැකි වූ නමුත් අවසානයේ දී ඔවුන් කඩාවැදී නිවාස කොල්ලකමින් සමහර කාමරවලට ගිණි තැබූහ.

සමහර මිෂනාරිවරුන් තුවාල ලැබූ අතර සියලුදෙනාටම නිවාස සහ සියලු දේපල පාහේ අහිමි විය. ටේලර් මහත්මිය මිතුරෙකුට මෙසේ ලියනු ලැබීය. පසුගිය පැය 48 තුළ අපි පසුකර ගිය අන්තරායන් ගැන ඔබට බොහෝ අදහසක් ලබාදිය හැකිදැයි මම නොදනිමි. අපේ දෙවියන් වහන්සේ ඒ තුළින් අපව ගෙන ගිය සේක. මෙතැන් සිට උන්වහන්සේගේ ප්‍රශංසාව සහ මහිමය සඳහා වඩාත් පූර්ණ ලෙස ජීවත්වීමට හැකි වේවා.

අපට තවත් සුළි කුණාටුවක් ඇති වී තිබේ. එය සුභාරංචියේ ඉදිරිගමනට නැඹුරුවීමක් වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

මිෂනාරිවරුන්ට ටික වේලාවකට මෙම ස්ථානවලින් පිටවයාමට සිදු වූ නමුත් එය ආරක්ෂිත යැයි හැගුණු වහාම ඔවුන් ආපසු පැමිණියෝය.

මිෂනාරිවරුන් බියට පත් වූ මැර කල්ලියෙන් දිවි ගලවාගත් බවත් තුවාල ලැබූවන් සම්පූර්ණයෙන්ම සුවය ලැබූ බවත් ඇසූ චීන අසල්වැසියන් සතුටු විය. දැන් ඔවුන් තම දරුවන් සමඟ ආපසු ගොස් ප්‍රේමයේ දේව සේවයේ යෙදීමට නිර්භීත වූහ.

මෙම අත්දැකීම් වලින් පසුව ටේලර් මහතා චීනයට යාමට අයදුම් කරන අපේක්ෂකයන් අනුමත කිරීමේ වගකීම දැරූ බර්ගර් මහතාට මෙසේ ලිවීය. චීනය දෙවියන් වහන්සේ වෙනුවෙන් දිනා ගැනීමට හැකිවන්නේ ආත්මාර්ථකාමීව සුව පහසුව සොයන පුරුෂයන්ට හා ස්ත්‍රීන්ට නොවේ. සේවය සඳහා සූදානම් නැති ආත්මපරිත්‍යාගයෙන් කටයුතු නොකරන බෙහෙවින්ම අධෛර්යයට පත්ව සිටින අය සේවයේ කාර්යයන්වලදී දුර්වල සහකරුවන් වන්නේය. චීනය යේසුස් වහන්සේ වෙතට ගෙන ඒමට සෑම දෙයකදීම හා සැමවිටම ආත්ම උදෙසා ප්‍රමුඛස්ථානය දෙන පුරුෂයන් සහ ස්ත්‍රීන් අපට අවශ්‍ය වන්නේය.

ඔවුන් තමන්ගේ ජීවිතය පරදුවට තබා ක්‍රියා කරන අයයි. එවැනි අයව යැවීමට බිය නොවන්න. ඔවුන්ගේ වටිනාකම රතුකැටවලටත් වඩා බෙහෙවින් වැඩිය. "

Reg. No: Dop/News/33/2025
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

ඔබ තුළ සිටින දෙවියන් වහන්සේගේ ආත්මයෙන් ඔබේ ජීවිතය මනින්න.

(වෙස්ලි එල්. ඩුවෙල් විසිනි)

දෙවියන් වහන්සේ මනින ආකාරයට ඔබේ ජීවිතය මැනීම කොයිතරම් දුෂ්කරද .. ? ඇත්ත වශයෙන්ම අප තුළ ආත්මයාණන් වහන්සේගේ පැවැත්ම, උන්වහන්සේ අපව පූර්ණ කිරීම, උන්වහන්සේ අපව පාවිච්චි කිරීම මැනිය හැකි වන්නේ කෙසේද..? ඒ අතරම බයිබලයේ පැහැදිලිව පෙන්වා දෙන්නේ දෙවියන් වහන්සේ එසේ කරන බවයි. සමහර මනුෂ්‍යයන් ආත්මයෙන් පූර්ණව සිටින බවත්, අපට ආත්මයෙන් (පූර්ණවීමට අණකර ඇති බවත් ශුද්ධ ලියවිල්ලේ නිශ්චිතවම සාක්ෂි දරයි. (එපීස 5:18) පෙන්තකොස්ත දිනයේ දී ප්‍රේරිතයන්ට ලබාගත හැකි වූ ආත්මික අත්දැකීම්වල ගැඹුරම අපටත් පොරොන්දුවී තිබේ. (ක්‍රියා 2:38-39) ඔබ දෙවියන් වහන්සේගේ ආත්මයෙන් පිරී ඇති ආකාරය අනුව ඔබේ ජීවිතය මැනීමට ඔබ එඩිතරද ... ?

දෙවියන් වහන්සේගේ හස්තය ඔබ මත තිබෙන බව ඔබ හොඳින් දැන සිටි අවස්ථා, ඔබගේ ජීවිතයේ සහ සේවයේ උන්වහන්සේගේ බලය ප්‍රකට වූ අවස්ථා ඔබ බොහෝ විට දැන සිටින්නට ඇත. එය ප්‍රතික්ෂේප කළ නොහැකි විය. එය පුදුමයට කරුණක් නොවේ. මක්නිසාද මෙය ශුද්ධාත්මයාණන් වහන්සේගේ නිදහස් කිරීමේ කාලයයි. උන්වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් ක්‍රියාශීලීව ක්‍රියා කිරීමට පැමිණ තිබෙන සේක. ක්‍රිස්තුස් වහන්සේගේ මිදීම සහ මිදීමේ ප්‍රතිඵල අපට අදාළ කිරීමට ක්‍රියාශීලී වන සේක.

ආත්මික ජීවිතයේ සියලුම කාරණා අප වෙත පැමිණෙන්නේ ජීවනදායක ආත්මයාණන් වහන්සේ තුලිනි. දෙවියන් වහන්සේගෙන් උපත ලැබීම යනු ආත්මයෙන් උපත ලැබීමයි. (යොහාන් 3:3-8) එතෙක් මනින ආත්මික ජීවිතයක් නොමැත. **"වේ වාංසයෙහි සිටින්නන්ට දෙවියන් වහන්සේ සතුටු කරන්ට නොහැකිය. නුවුත් නුඹලා තුළ දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ වාසය කරන සේක් නම්, නුඹලා වාංසයෙහි නොව, ආත්මයෙහි සිටින්නෝය. ක්‍රිස්තුස් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ යම් කෙනෙකුට නැත්නම් ඔහු උන්වහන්සේට අයිති නැත. "** (රෝම 8:8-9) කෙසේ වෙතත් ක්‍රිස්තුස් වහන්සේට අයිති සෑම කෙනෙක් තුළම ශුද්ධාත්මයාණන් වහන්සේ ඇතත් සමහර කිතුණුවන් අන් අයට වඩා ආත්මයාණන් වහන්සේගේ පැමිණීමෙන් කැපී පෙනෙයි. යේසුස් වහන්සේ පැමිණියේ අපට ආත්මික ජීවිතයක් ලබාදීමට සහ එය බහුල ලෙස ලබාදීමට වන සේක. (යොහාන් 10:10) ශුද්ධාත්මයාණන් වහන්සේව ලබාදී ඇත්තේ උන්වහන්සේගේ සම්පූර්ණත්වය තුළ අප වාසය කිරීමටය. උන්වහන්සේගේ ශුද්ධ, සර්ව බලධාරී පෞර්ෂය තුලින් අපගේ සීමිත පෞර්ෂයන් පිරවීමට ආශා කරන සේක.

ආත්මයාණන් වහන්සේගේ පුද්ගලිකභාවය සහ කාර්යයන්

උන්වහන්සේ ත්‍රිත්වයේ ආශිර්වාදලත් තුන්වෙනි තැනැත්තා වහන්සේ වන ශුද්ධ වූ ආදරණීය පුද්ගලයෙකි. උන්වහන්සේ නිශ්ශබ්දව පිනි මෙන් ඔබව ප්‍රබෝධමත් කරන සේක. උල්පතක් හෝ උල්පතක් වැනි ආශිර්වාද වලින් ඔබ තුළ පැන නගින සේක. උන්වහන්සේ ඔබ තුළ ගංගාවක් මෙන් ගලායන සේක. පරණ ගිවිසුමේ ආනගතවකතෘවරුන්ව වෙන්කර ඇති පරිදි උන්වහන්සේගේ ආලේපයෙන් උන්වහන්සේ ඔබව වෙන්කර ගන්නා සේක. උන්වහන්සේ තමන්වහන්සේගේ ශුද්ධ වූ ගින්නෙන් ඔබව පවිත්‍ර කරන සේක. (1 තෙසලෝනික 5:23) ප්‍රේමයේ සහ ජීවලිතයේ ශුද්ධ ආශාවන් ඔබ තුළ ඇවිලෙන සේක. උන්වහන්සේ මේ සියල්ල ඉතා අලංකාරව සහ ත්‍රාසජනක ලෙස කරනු ලබයි.

නමුත් සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨතම යතාර්ථය නම් උන්වහන්සේ ඔබ තුළ වාසය කරන ශුද්ධ වූ සමාගම්කාරයාණෝ, උපදේශකයාණෝ, මඟපෙන්වන්නා, උපකාරකයාණෝ සහ ස්වාමියාවීමයි. උන්වහන්සේ ක්‍රිස්තුස් වහන්සේගේ සියලු මිදීමේ කරුණාව ඔබේ හදවතට අදාළ කරන සේක. ශුද්ධ වූ ජීවිතය සහ සේවය සඳහා ඔබව සන්නද්ධ කරනු ලබයි. දෙවියන් වහන්සේ වෙනුවෙන් ආත්මික යුද්ධය සඳහා ඔබව බලගන්වන සේක. ඇදහිලිවන්තයෙකු ලෙස ඔබ සම්පූර්ණ කැපවීමෙන් ඔබේ සියල්ල ලබාදෙන විට ආත්මය පවිත්‍ර කර විශුද්ධ කරනු ලබයි. (යොහාන් 17:17, ක්‍රියා 15 :89, 2 තෙසලෝනික 2:13) එමෙන්ම ඔබව ආත්මයෙන් පුරවන සේක. (ක්‍රියා 2:4, 39, එපීස 5:18) ආත්මයාණන් වහන්සේට දැන් ඔබගේ මුළු පැවැත්ම තුළම උන්වහන්සේගේ ශුද්ධ වූ ස්වාමීත්වය ක්‍රියාත්මක කිරීමට හැකි වන අතර ඔබව ජයග්‍රහණය කරවීමටත්, ඔබ ක්‍රිස්තුස් වහන්සේට සේවය කරන ආකාරයටම ඔබව බලවත් කිරීමටත්, පාවිච්චි කිරීමටත් හැකි වන සේක. (ලුක් 24:49, ක්‍රියා 1:8)

ක්‍රිස්තුස් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ ඵල ලෙස විස්තර කරන ක්‍රිස්තුස් වහන්සේගේ සමානත්වයේ ශුද්ධ වූ බහුලත්වයන් ඔබ තුළ වැඩි කිරීමට ආත්මයාණන් වහන්සේට නිදහස තිබෙන සේක. (රෝම 8:23, ගලාති 5:22,-23) උන්වහන්සේ එසේ කරන්නේ ඔබව තව තවත් ක්‍රිස්තුස් වහන්සේට සමාන කිරීමට වන සේක. උන්වහන්සේට යටහත් වූ ඔබගේ ආත්මය සම්පූර්ණයෙන් හිමිකරගෙන උන්වහන්සේ ඔබ තුළ සිට උන්වහන්සේගේ දිව්‍යමය කාර්යය ඉටුකරනු ලබයි. උන්වහන්සේ ඔබට මඟපෙන්වන සේක. (රෝම 8:14, යෙසයා 58:11) මක්නිසාද උන්වහන්සේ ඔබගේ උපදේශකයාණෝය. (යොහාන් 14:26) උන්වහන්සේ යාච්ඤා කිරීමට ඔබට මඟපෙන්වන සේක. (රෝම 8:26-27) ඔබගේ බලවත් වූ උපකාරයාණෝය. (යොහාන් 14:26) උන්වහන්සේ ඔබව ආලේප කරන සේක. (2 කොරින්ති 1:21-22, යොහාන් 2:20,27)

දෙවියන් වහන්සේගේ දරුවෙකු වශයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ තුළ වාසය කිරීම, ඔබව පූර්ණ කිරීම, ඔබට බලය ලබාදීම ඔබට ඇති උතුම් වරප්‍රසාදයයි. උන්වහන්සේ ඔබව පවිත්‍ර කර පූර්ණ කිරීමට හැකි වන පරිදි සම්පූර්ණ යටහත්වීම සිදු කළ පසු ඔබ උන්වහන්සේගේ ස්වාමීත්වය යටතේ ජීවත්වෙමින් උන්වහන්සේට සේවය කරන විට ඔබව නැවත නැවතත් පිරවිය හැකිය. ඉල්ලන්න එවිට ඔබට ලැබෙනු ඇත. (ලුක් 11:13)

ප්‍රවේශමෙන් ඇගයීම (තක්සේරු කිරීම)

ඔබගේ ජීවිතය මනින්න. ඔබගේ ජීවිතය තක්සේරු කරන්න. ඔබගේ කැඳවීමට ඔබ කොයිතරම් සම්පූර්ණ ලෙස ජීවත්වෙනවාද ..? ඔබව විශුද්ධ කිරීමට යේසුස් වහන්සේ උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේව ලබාදෙන සේක. (1 තෙසලෝනික 5:23-24) උන්වහන්සේගේ පවිත්‍රකරණයෙන් ඔබ කොයිතරම් ප්‍රයෝජන ගෙන තිබෙනවාද ..? බොහෝ ගීතිකා මෙම ආශිර්වාදලත් යථාර්ථය ප්‍රකාශ කිරීමට උත්සාහ කර ඇත. "චාල්ස් වෙස්ලි" මෙසේ ලිවීය.

මා තුළ පූජණීය ගින්න
දැන් දිළිසෙන්නට පටන් ගනීවි
පහත් ආශාවේ කුණු පුළුස්සා
කුණු දියවී යාවි
ගින්නෙන් පිරිපහදු කරන්න
මගේ හදවත හරහා ගොස්
මගේ ආත්මය ආලෝක කරන්න
ඔබේ ජීවිතයේ සෑම කොටසක් හරහාම විසිරී ගොස්
මුළු ජීවිතයම විශුද්ධ කරත්වා ... !

ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ තුළ වාසය කරන විට පිරිසිදු කරන දැවෙන ගින්නෙන් ඔබේ ජීවිතය මනින්න. උන්වහන්සේට ඔබව පුරවා පිරිසිදු කිරීමට හැකි වන පරිදි සම්පූර්ණ යටහත්වීම ඔබ කර තිබේද ..? ඔබ තුළ ඇති ආත්මයේ පූර්ණත්වය මගින් ඔබගේ ජීවිතය මනින්න. ඔබගේ ජීවිතය තුළ ආත්මයාණන් වහන්සේගේ පැවැත්ම සහ බලය ප්‍රකාශ වන්නේ අවම වශයෙන්ද ..? උන්වහන්සේ ඔබව පුරවා උන්වහන්සේගේ ශුද්ධ අභිමුඛත්වයෙන් ඔබව උතුරා යාමට සලස්වන බව පැවසීම සැබෑ සාක්ෂියක්ද ..? ආත්මයේ ඵලවල බහුලත්වය මගින් ඔබගේ ජීවිතය මැන බලන්න. ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසවන්තකම, මෘදුකම පමණ දැන ක්‍රියා කිරීම යන ගලාති 5:22 වන පදයේ සඳහන් වන ආත්මයාණන් වහන්සේගේ ඵලවල බහුලත්වය ඔබගේ ආත්මික ජීවිතයේ සෑම අංශයක් තුළ නිරතුරුව පවතිනවාද ..?

මෙය කුරුසියේ ඇණගසන ලද ජීවිතයේ තවත් ආකාරයක් බව පාවුල් තුමා ඊළඟ පදයෙන් පැහැදිලි කරනු ලබයි. **"නවද ක්‍රිස්තුස් වහන්සේට අයිති තැනැත්තෝ මාංසය එහි ආශා සහ තෘෂ්ණා සමඟ කුරුසියෙහි ඇණගැසුවෝය."** (ගලාති 5:24) කුරුසියේ ඇණ ගසන ලද ස්වභාවයට පමණක් ආත්මයාණන් වහන්සේගේ ඵල බාධාවකින් තොරව ලබාදිය හැකිය. ඔබ කුරුසියේ ඇණ ගසනු ලබා සිටිනවාද ..? පාවුල්තුමා මෙලෙස එය එකට එකතු කර සාරාංශ කරනු ලබයි. **"අපි ආත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන හැසිරෙමු. නිශ්චල පාර්ථිව නොකරමු. එකිනෙකා කෝප නොකරමු. එකිනෙකාට ඊර්ෂ්‍යා නොවෙමු."** (ගලාති 5:25)

ඉතිරි කොටස ඊළඟ කලාපයෙන්

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මූලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.